# ජාතික සමාජ සංවර්ධන ආයතනය

*(සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය*

*පිළිබඳ අමාත්‍යාංශය)*

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත උපාධි පිරිනමනු ලබන ආයතනයකි**



# වාර්ෂික වාර්තාව-2018

| | පිටු අංකය |
|---|---|
| වාර්ෂික වාර්තාව 2018 | 03-82 |
| අවසන් ගිණුම 2018 | 83-102 |
| විගණකාධිපති වාර්තාව | 103-104 |
| අවසාන ගිණුම් පිළිබඳ විගණන මතය | 105-110 |
| විගණකාධිපති වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්ගේ නිරීක්ෂණයන් | 111-117 |

# ජාතික සමාජ සංවර්ධන ආයතනය

## දැක්ම

**සමාජ වැඩ අධ්‍යාපනයේ පුහුණු කටයුතුවල හා පර්යේෂණවල දේශීය හා ජාත්‍යන්තර ලෙස විශිෂ්ඨ මධ්‍යස්ථානයක් බවට පත්වීම.**

## මෙහෙවර

**ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය සහ සමාජ සුභසාධනය සඳහා සියලුම මට්ටම්වලදී අවශ්‍ය සමාජ වැඩ පිළිබඳ කුසලතා පූර්ණ මිනිස් බල අවශ්‍යතා සපුරාගැනීම සමාජ වැඩ පිළිබඳ අවශ්‍ය දැනුම හා තාක්ෂණයන් යොදා ගනිමින් සමාජයට සුවිශේෂී සේවයක් සැපයීම.**

# සමාලෝචනය

සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික සමාජ සංවර්ධන ආයතනය සමාජ වැඩ පිළිබඳව (Social Work) අධ්‍යාපනය ලබාදෙන ශ්‍රී ලංකාවේ ඇති එකම අධ්‍යාපන ආයතනයවේ.1992 අංක 41 දරණ පාර්ලිමේන්තු පනත මගින් ජාතික සමාජ සංවර්ධන ආයතනය නමින් උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස ස්ථාපිත වූ මෙම ආයතනය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පනතේ 25 A වගන්ති යටතේ උපාධි පිරිනැමීමට බලය ඇති ආයතනයක් ලෙස 2005 වර්ෂයේදී ප්‍රකාශයට පත් කර ඇත.සමාජ සංවර්ධනය උදෙසා සමාජ වැඩ, සමාජ සුභසාධනය, සමාජ සංවර්ධනය සහ මනෝ විද්‍යාත්මක උපදේශනය යන ක්ෂේත්‍රයන්ට අදාළ අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ වැඩසටහන් හා පාඨමාලා ගණනාවක් සතුටුදායක ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී. ඉහත කාර්යයන් සාර්ථක ලෙස ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලය, පුහුණු අංශය හා පර්යේෂණ අංශය ලෙස දැනට අධ්‍යයන අංශ තුනක් ක්‍රියාත්මක වෙමින් පවතින අතර ඊට අමතරව පාලන හා මුදල් අංශයක්ද ක්‍රියාත්මක වේ.

අධ්‍යයන අංශ මගින් ක්‍රියාත්මක කරනු ලබන පශ්චාත් උපාධි, උපාධි, උසස් ඩිප්ලෝමා, ඩිප්ලෝමා, සහතික පත්‍ර හා පුහුණු හා පාඨමාලා සියල්ලම ජාතික අවශ්‍යතාවයට ගැලපෙන පරිදි අවශ්‍යතා තක්සේරු වාර්තා අනුව සකස් කරන ලද විෂය නිර්දේශයකින් සමන්විතවේ. මෙම විෂය නිර්දේශයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා නිර්දේශයන්ට අනුව (SLQF) ඉතා උසස් මට්ටමකින් අදාල ක්ෂේත්‍රයේ වෘත්තිකයින්, අධ්‍යාපනඥයින් හා අභ්‍යන්තර කාර්ය මණ්ඩලය එක්ව සකසා ඇත.

සමාජ සේවා විද්‍යාලය මගින් පවත්වන වැඩ සටහන් අතර වෘත්තීය සමාජ වැඩ පිළිබඳ, ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා හා ශාස්ත්‍රවේදී උපාධිය හා සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ප්‍රධානවේ. මීට අමතරව කාන්තාව සවිබල ගැන්වීම පිළිබඳ පාඨමාලා, ළමා රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා මෙම අංශය මගින් පවත්වා ගෙන යනු ලැබේ.මීට අමතරව සංඥා භාෂා පරිවර්තක ඩිප්ලෝමා පාඨමාලාව මෙම වසරේදී ආරම්භ කරන ලදී.

පුහුණු අංශය මගින් ඩිප්ලෝමා පාඨමාලා රාශියක් පවත්වාගෙන යන අතර උපදේශනය, වැඩිහිටි රැකවරණය, සමාජ රැකවරණය, ප්‍රජා පාදක විශෝධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවන් මේ අතර ප්‍රධාන වේ. එමෙන්ම උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ වී ඇති අතර එය උපාධි පාඨමාලාවක් දක්වා සංවර්ධනය කරමින් පවතී. මීට අමතරව සහතික පත්‍ර පාඨමාලා හා කෙටි කාලීන පුහුණු වැඩසටහන් දිවයින පුරා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි ඉල්ලීම පරිදි පවත්වනු ලබන අතර මෙමගින් සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ නියුතු නිලධාරීන්ගේ ධාරිතාවය වර්ධනය කිරීම අරමුණ වේ. කොළඹ කේන්ද්‍රස්ථානය කරගනිමින් යාපනය, මන්නාරම, කිලිනොච්චිය, අම්පාර, වවුනියාව, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුරය සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කයන්හි ඉහත පාඨමාලා දැනට පවත්වාගෙන යනු ලබයි.

පර්යේෂණ හා ප්‍රකාශන අංශය විසින් ශ්‍රී ලාංකේය සමාජ ප්‍රත්පත්ති ගොඩනැංවීම උදෙසා විවිධ පර්යේෂණ රාශියක් දියත් කොට ඇත. එම අංශ විසින් පර්යේෂණ මුල් කරගනිමින් සකස්කොට ඇති පර්යේෂණ වාර්තා හා ග්‍රන්ථ සමාජ සංවර්ධන හා සමාජ සුභසාධන ක්ෂේත්‍ර සංවර්ධනය සඳහා බෙහෙවින්ම යොදාගත හැක.

ආයතනයට අනුබද්ධිතව ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන හතරක් අනුරාධපුර තලාව, අම්පාර, හම්බන්තොට රන්න හා කිලිනොච්චි යන ප්‍රදේශයන්හි ආරම්භ කර ඇත. කොළඹට කේන්ද්‍ර වෙමින් පවතින ආයතනික වැඩසටහන්
ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශයන්හි වෙසෙන සිංහල, දමිළ, මුස්ලිම් ප්‍රජාව වෙත රැගෙන යාම මෙම ප්‍රාදේශීය මධ්‍යස්ථාන ආරම්භ කිරීමේ අරමුණ වේ.

එමෙන්ම ආයතනයට ස්ථිර ගොඩනැගිලි සංකීර්ණයක් සීදුව ප්‍රදේශයේ ඉදිකිරීම සඳහා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ඒ අනුව ගොඩනැගිලි සංකීර්ණය සඳහා රුපියල් බිලියන 01 ක මුදලක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් වෙන්කර ඉදිකිරීම් කටයුතු ද මේ වනවිට ආරම්භ කර ඇත.

ආයතනය මගින් ජාතික මෙන්ම ජාත්‍යන්තර ආයතන හා සංවිධාන සමඟ විවිධ වූ අධ්‍යයන වැඩසටහන් පවත්වාගෙන යන අතර එමගින් ආයතනයේ අරමුණු හා කාර්යභාරය ප්‍රජාව අතරට ගෙන යාමේ අවස්ථා තවත් පුළුල් වී ඇත. වර්තමානයේ ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය උදෙසා ආයතනය මගින් මහඟු කාර්යභාරයක් ඉටු කරමින් සිටින අතර 66 වසරක ඉතිහාසය තුල ආයතනය මඟින් සිදු කරන මෙම සමාජ සත්කාරය ප්‍රශංසනීය බව ප්‍රකාශ කරමි.

එම්.ටී.ආර්. ෂාමිණී අත්තනායක

අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)
ජාතික සමාජ සංවර්ධන ආයතනය

# ජාතික සමාජ සංවර්ධන ආයතනය

## වාර්ෂික වාර්තාව - 2018

### හැඳින්වීම

ජාතික සමාජ සංවර්ධන ආයතනය සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 25 A වගන්තිය යටතේ උපාධි පිරිනමනු ලබන ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නම් කරනු ලැබූ අධ්‍යයන, පුහුණු හා පර්යේෂණ වැඩසටහන් රාජ්‍ය මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන ආයතනයකි. අප ආයතනයේ ප්‍රධාන විෂයය ධාරාව වනුයේ සමාජ වැඩ පශ්චාත් උපාධි / සමාජ වැඩ උපාධි/ උසස් ඩිප්ලෝමා හා සමාජ වැඩ ඩිප්ලෝමා පාඨමාලාවන්ය. මීට අමතරව සමාජ සුභසාධනය, සමාජ සංවර්ධනය හා මනෝ විද්‍යාත්මක උපදේශන වැඩසටහන් ද දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙම ආයතනයේ ඉතිහාසය 1952 වර්ෂය දක්වා වන අතර එය ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලය වශයෙන් නම් කරන ලදී. 1952 දී ස්වේච්ඡා සංවිධාන කිහිපයක් පුරෝගාමීත්වයෙන් මෙම ක්ෂේත්‍රයේ පළමු දේශීය අධ්‍යාපන ආයතනය ලෙස ලංකා සමාජ වැඩ ආයතනය බිහිවිය. එමඟින් සමාජ සුභසාධන ක්ෂේත්‍රයට අවශ්‍ය වූ පුහුණු මිනිස් ශ්‍රමය රටට සැපයිනි. ආරම්භයේදී ආයතනය විසින් සමාජ වැඩ එක් අවුරුදු සහතිකපත්‍ර පාඨමාලාවක් හා වෙනත් කෙටිකාලින පුහුණු පාඨමාලා පවත්වාගෙන යන ලදී. වර්ෂ 1964 දී මෙම ආයතනය රජයට පවරාගනු ලැබූ අතර, එය ලංකා සමාජ සේවා විද්‍යාලය ලෙස ස්ථාපිත විය. එමඟින් දෑඅවුරුදු සමාජ වැඩ ඩිප්ලෝමා පාඨමාලාව හා වෙනත් කෙටිකාලීන වෘත්තීය පුහුණු පාඨමාලා පවත්වාගෙන යන ලදී. මෙලෙස ආරම්භ වූ ශ්‍රී ලංකාවේ සමාජ වැඩ අධ්‍යාපනය තවදුරටත් වර්ධනය වීමත් සමඟම 1992 අංක 41 දරණ පාර්ලිමේන්තු පනත මඟින් ජාතික සමාජ සංවර්ධන ආයතනය පිහිටුවන ලදී. ජාතික සමාජ සංවර්ධන ආයතනය සමාජ සේවා විද්‍යාලය, පර්යේෂණ හා ප්‍රකාශන අංශය සහ පුහුණු අංශය යන අංශවලින් සමන්විත වේ. සමාජ සේවා විද්‍යාලය මඟින් දියත් කරනු ලබන අධ්‍යයන වැඩසටහන් අතුරින් වෘත්තිය සමාජ වැඩ ඩිප්ලෝමා පාඨමාලාව, සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව සහ සමාජ වැඩ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව ප්‍රධාන තැනක් ගනී. 2005, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මඟින් මෙම ආයතනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ උපාධි පිරිනමන ආයතනයක් වශයෙන් නම් කරන ලදී.

### 1.2 ආයතනයේ සංවිධාන ව්‍යුහය

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පරිපාලනයේ හා කළමනාකරණයේ කේන්ද්‍රීය ව්‍යුහය වනුයේ පාලක සභාවයි. ආයතනයේ පරිපාලනය, කළමනාකරණය හා පාලනය සම්බන්ධ වන කටයුතු භාරව කටයුතු කරනුයේ පාලක සභාවයි. පාලක සභාව යටතේ ක්‍රියාත්මක අධ්‍යයන කටයුතු මණ්ඩලය (AAB) අධ්‍යයන කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධව උපදේශාත්මක මණ්ඩලය වශයෙන් කටයුතු කෙරේ.

ආයතනයේ සාමාන්‍ය ක්‍රියාකාරී කටයුතු ප්‍රධාන එකිනෙකට බද්ධ වූ අංශ 4 කින් ක්‍රියාත්මක කරනු ලැබේ. ඒවා නම්,

1. සමාජ සේවා විද්‍යාලය
2. පුහුණු අංශය
3. සමාජ සංවර්ධන, ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය
4. මුදල් හා පරිපාලන අංශය

මෙහි මුල් අංශ තුන අධ්‍යයන කටයුතු හා සම්බන්ධ අංශයන් වේ. වර්තමානයේ සමාජ සේවා විද්‍යාලය ප්‍රධාන අධ්‍යයන වැඩසටහන් තුනක් පවත්වාගෙන යනු ලැබේ. ඒවා නම්, දෑ අවුරුදු සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව, සිව් අවුරුදු සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව සහ දෑඅවුරුදු සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව වේ.

පුහුණු අංශය මඟින් මාස 21 ක උපදේශන පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව පවත්වනු ලබන අතර, වෙනත් අභ්‍යන්තර හා බාහිර පුහුණු වැඩසටහන්ද ක්‍රියාත්මක කරනු ලැබේ. සමාජ සංවර්ධනය, සමාජ සුභසාධනය හා සමාජ වැඩ යන ක්ෂේත්‍රයන්ට අදාළ පර්යේෂණ කටයුතු සිදුකිරීම සහ ඊට අදාළ පර්යේෂණවල නිරත වීම පර්යේෂණ අංශයේ කාර්යභාරය වේ.

ආයතනයේ සියළුම පරිපාලන හා මූල්‍ය කටයුතු මුදල් හා පරිපාලන අංශය කටයුතු කෙරේ. අධ්‍යක්ෂ ජනරාල්වරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා වේ.

## 1.3 ආයතනයේ අරමුණු

**1992 අංක 41 දරණ ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ සඳහන් කර ඇති පරිදි ආයතනයේ අරමුණු වනුයේ,**

01. වෘත්තීය සමාජ වැඩ අධ්‍යාපනය, සමාජ සුභසාධන කළමනාකරණය හා සමාජ සංවර්ධනය පිළිබඳ උසස් පාඨමාලා පැවැත්වීම, ප්‍රවර්ධනය හා ඒවා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් මට්ටමකට ගෙන යාම.
02. පුහුණු පාඨමාලා පුළුල් කිරීම, ශක්තිමත් කිරීම, සමාජ සුභසාධනය සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ වෙනත් ආයතන සමඟ සහයෝගීත්වයෙන් ඒවා පැවැත්වීම, අඩු වරප්‍රසාද ලාභීන් බලගැන්වීම, මානව කුසලතා හා වෘත්තීය කුසලතා සංවර්ධනය තුලින් පුද්ගලයන්ට වඩා හොඳ ජීවන මට්ටමක් ලබා දීම.
03. සමාජ වැඩ අධ්‍යාපනය, පුහුණුව හා සමාජ සුභසාධනය හා සංවර්ධනයට අදාල පර්යේෂණ කටයුතු කිරීම, ප්‍රවර්ධනය හා පවත්වාගෙන යාම තුලින් සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ දියුණුව සැලසීම.
04. සමාජ සුභසාධනය හා සමාජ සංවර්ධනය සම්බන්ධ ප්‍රතිපත්ති සැකසීමට, සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විශේෂ දායකත්වය සැපයීම.
05. ඉහත සියළුම අරමුණු සාර්ථකව ලඟා කර ගැනීමට අවශ්‍ය වන මූල්‍යමය අධ්‍යයන හා අනධ්‍යයන මිනිස් බලය හා විශේෂයෙන් ජාතික සමාජ සංවර්ධන ආයතනයට ස්ථිර ස්ථානයක් ස්ථාපනය කර ගැනීම වැනි යටිතල පහසුකම් ඇතුලු අනෙකුත් සම්පත් ලබා ගැනීම

## 1.4 ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම ආයතනය පහත සඳහන් කාර්යන්හි නිරත වේ.

01. සමාජ වැඩ වෘත්තියවේදී අධ්‍යාපනය ලබා දීම.
02. සමාජ වැඩ පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර පුහුණු පාඨමාලා පැවැත්වීම.
03. සමාජ වැඩ, සමාජ සුභසාධනය සහ සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ පර්යේෂණ හා ප්‍රකාශන පළ කිරීම.
04. සමාජ සුභසාධන ක්ෂේත්‍රයේ උපදේශන සේවා පැවැත්වීම.
05. සමාජ සුභසාධන කටයුතු වල නියැලී සිටින රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල සේවකයින්ගේ කළමනාකරණ හා වෘත්තිය කුසලතා වැඩි දියුණු කිරීම.
06. සමාජ සුභසාධන ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ගරු ඇමතිතුමාට අවශ්‍ය උපදෙස් ලබා දීම.

## 1.5 ජාතික සමාජ සංවර්ධන ආයතනය මඟින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්

01. සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති, සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලා, සමාජ වැඩ ඩිප්ලෝමා, අතුරු වෘත්තීය පාඨමාලා හා වෙනත් පුහුණු පාඨමාලා සඳහා විෂයමාලා සංවර්ධනය, සංවිධානය කිරීම, පැවැත්වීම සහ ක්ෂේත්‍ර වැඩ සම්බන්ධීකරණය

02. සමාජ සුභසාධන හා සමාජ ප්‍රතිපත්ති පිළිබඳ පර්යේෂණ සිදු කිරීම, ප්‍රවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම

03. සමාජ වැඩ හා සම්බන්ධ ප්‍රකාශන එළි දැක්වීම

04. සමාජ සුභසාධන කාර්යන්හි නියැලෙන රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල නිලධාරින්ගේ වෘත්තීමය කළමනාකරණ හැකියා සංවර්ධනය කිරීම සඳහා විදේශීය හා දේශීය ආයතන වල මූල්‍ය පහසුකම් ඇතිව සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම

05. ගරු ඇමතිතුමාට සමාජ සුභසාධන ප්‍රතිපත්ති සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට සහාය වීම සහ ඒ සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනිමට අවශ්‍ය උපදෙස් ලබා දීම.

06. රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශ වල සමාජ සුභසාධන සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී සමාජ වැඩ සිසුන් එම ආයතන වලට ඔවුන්ගේ ව්‍යාපෘති මඟින් අනුයුක්ත කිරීම, ඔවුන්ගේ සංවර්ධන ක්‍රියාදාමයන්ට අවශ්‍ය මාර්ගෝපදේශයන් සැපයීම, ඔවුන්ගේ සේවාවන් වඩාත් අර්ථවත් පිණිස උපදේශන සේවා රැස්වීම් හා සම්මන්ත්‍රණ පැවැත්වීම.

## 1.6 ජාත්‍යන්තර වෘත්තීය සමාජ වැඩ සංවිධාන සමඟ සබඳතා

ආයතනය ජාත්‍යන්තර වෘත්තිය සමාජ වැඩ සංවිධාන ගණනාවක සාමාජිකත්වට දරයි

1. ජාත්‍යන්තර සමාජ සේවා විද්‍යාල සංගමය (IASSW)
2. සමාජ සංවර්ධවය පිළිබඳ ජාත්‍යන්තර කොන්සෝටියම (ICISD)
3. සමාජ වැඩ කරුවන්ගේ ජාත්‍යන්තර ෆෙඩරේෂනට (IFSW)
4. සමාජ වැඩ අධ්‍යාපනය පිළිබඳ ආසියා පැසිෆික් සංගමය (APASWE)

## 02. පාලක සභාව

1992 අංක 41 දරණ ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ 7 (1) උප වගන්තිය ප්‍රකාරව 2018 වර්ෂයේ ජාතික සමාජ සංවර්ධන ආයතන පාලක සභාවේ සංයුතිය මෙසේය.

| | | | |
|---|---|---|---|
| 1. | ඩබ්.ජේ.පී.එස්. වීරකෝන් මිය<br>(සභාපති -නිල බලයෙන් ) | - | ලේකම්,සමාජ සවිබල ගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය<br>2017.08.03 සිට 2018 ඔක්තොම්බර් දක්වා |
| 2. | එච්.එම්. ගාමිණී සෙනෙවිරත්න මහතා<br>(සභාපති -නිල බලයෙන් ) | - | ලේකම් - ප්‍රාථමික කාර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br>2018.12.21 සිට මේ දක්වා |
| 3. | ආචාර්ය රිඩ්ලි ජයසිංහ මහතා | - | අධ්‍යක්ෂ ජනරාල් 2013.01.01 -2018.07.08 දක්වා<br>ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| 4. | එම්.ටී.ආර්. ෂාමිණි අත්තනායක මිය | - | අධ්‍යක්ෂ ජනරාල් (රා.ආ.)2018.07.09 සිට මේ දක්වා |
| 5. | මහාචාර්ය වයි. රාසනායගම් මහත්මිය | - | සාමාජික |
| 6. | එස්.පී. විරසූරිය මහත්මිය | - | සාමාජික |

7. මහාචාර්ය එස්.ඩබ්. අමරසිංහ මහතා - සාමාජික
8. මහාචාර්ය පී.එස්.එම්. ගුණරත්න මහතා - සාමාජික
9. ඊ.කේ. ගනිහිගම මහතා - සාමාජික
10. ජේ.එම්.එස්.ඩී. රත්නායක මිය - සාමාජික
11. ආචාර්ය එස්.ආර්.එස්.එන්. සුදසිංහ මෙය - සාමාජික
12. මහාචාර්ය පූජ්‍ය අයි. ඉන්ද්‍රසාර හිමි - සාමාජික
13. මහාචාර්ය ඩී.පී.ඩී. අමරසේකර මහතා - සාමාජික
14. ආචාර්ය එස්.එම්.ඒ.කේ. සමරකෝන් මහතා - සාමාජික
15. එස්.ටී. දන්තනාරායන මහතා - සාමාජික
16. ආචාර්ය එස්.ජේ. නවරත්න මහතා - සාමාජික
17. ආචාර්ය රිඩ්ලි ජයසිංහ මහතා - සාමාජික
18. ආචාර්ය එච්.එම්.සී.ජේ. හේරත් මිය - සාමාජික
19. පූජ්‍ය තිණියාවල පාලිත හිමි - සාමාජික
20. මහාචාර්ය එම්. තිලකසිරි මහතා - සාමාජික
21. මහාචාර්ය එච්.ඩබ්. සිරිල් මහතා - සාමාජික

## 03 අධ්‍යයන කටයුතු පිළිබඳ මණ්ඩලය

1992 අංක 41 දරණ ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ 10 (1) උප වගන්තිය ප්‍රකාරව පත් කරන ලද අධ්‍යයන කටයුතු මණ්ඩලය මෙසේය.

| | | | |
|---|---|---|---|
| 1. | ඩබ්.ජේ.පී.එස්. වීරකෝන් මිය (සභාපති -නිල බලයෙන් ) | - | ලේකම්,සමාජ සවිබල ගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය |
| 2. | ආචාර්ය රිඩ්ලි ජයසිංහ මහතා | - | අධ්‍යක්ෂ ජනරාල් ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| 3. | එම්.ටී.ආර්. ෂාමිණි අත්තනායක මිය | - | අධ්‍යක්ෂ ජනරාල් (රා.ආ.) |
| 4. | මහාචාර්ය වයි. රාසනායගම් මහත්මිය | - | කුලපති, නැගෙනහිර විශ්වවිද්‍යාලය |
| 5. | මහාචාර්ය ඩබ්.එම්. ධනපාල මහතා | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| 6. | මහාචාර්ය දයා එදිරිසිංහ මහතා | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| 7. | මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා මහතා | - | පීඨාධිපති සමාජ විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 8. | ආචාර්ය උපාලි පන්නිලගේ මහතා | - | පීඨාධිපති මානව ශාස්ත්‍ර පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය |
| 9. | ආචාර්ය ඒ.ඩබ්.කේ.ඩබ්. සුභසිංහ මහත්මිය | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - කැළණිය විශ්වවිද්‍යාලය |
| 10. | ගෞරි වාසුදේවන් මිය | - | අධ්‍යක්ෂ (පුහුණු අංශය), ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| 10. | කේ.එම්.වයි. කරුණාරත්න මහතා | - | අධ්‍යක්ෂ (සමාජ සේවා විද්‍යාලය) , ජා.ස.ස.ආයතනය |
| 11. | එම්.එස්.එම්. අස්මියාස් මහතා | - | අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය) ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| 12. | ආචාර්ය උපාලි පන්නිලගේ මහතා | - | පීඨාධිපති - මානව ශාස්ත්‍ර පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය |

13. සී.එච්.ඩී. හෙට්ටිආරච්චි මහත්මිය - ලේඛකාධිකාරී,ජා.ස.ස.ආයතනය, ලේකම් - අධ්‍යයන කටයුතු මණ්ඩලය

04. කාර්ය මණ්ඩලය

01. අචාර්ය රිඩ්ලි ජයසිංහ - අධ්‍යක්‍ෂ ජනරාල් 2013.01.01 -2018.07.08 දක්වා

02. එම්.ටී.ආර්.එස්. අත්තනායක මිය - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යයන)
අධ්‍යක්‍ෂ ජනරාල් (රාජකාරී ආවරණ) 2018.07.09 සිට මේ දක්වා

(අ) අධ්‍යයන කාර්ය මණ්ඩලය (සමාජ සේවා විද්‍යාලය)

2018 වර්ෂය තුල ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සමාජ සේවා විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය

01. කේ.එම්.වයි. කරුණාරත්න මහතා - අධ්‍යක්ෂ (සමාජ සේවා විද්‍යාලය)

02. වර්ධරාජා ජයරුබන් මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

03. ‍ඊ.ඒ.එම්.එස්.ජී. විජේසේකර මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

04. පූජ්‍ය ඕමල්පේ සෝමානන්ද හිමි - කථිකාචාර්ය I

05. යු.එල්.එම්. අශ්කර් මහතා - කථිකාචාර්ය I

06. එස්. හරිහරතාමෝදරන් මයා - කථිකාචාර්ය II

07. එස්. සිවකුමාරන් මිය - කථිකාචාර්ය II

08. එම්.කේ.පී.අයි.යු. ගුණරත්න මිය - කථිකාචාර්ය II

09. සී.එම්. මුණසිංහආරච්චි මිය - කථිකාචාර්ය II

10. වී. බාලමති මිය - කථිකාචාර්ය II

11. ඩබ්.බී.එච්. ජයවර්ධන මෙනවිය - කථිකාචාර්ය II

12. එච්.එම්.ඩී.එස්. හේරත් මිය - කථිකාචාර්ය II

13. එල්.ආර්. අබේවික්‍රම මෙනවිය - කථිකාචාර්ය II

14. එච්.එම්.එස්. නිරෝෂණී මිය - කථිකාචාර්ය II

15. එල්.සී. ඉනෝකා ජයසේන මිය - කථිකාචාර්ය II

16. වයි.එච්. සමුද්‍රිකා සිල්වා මෙනවිය - කථිකාචාර්ය II

17. ඒ.එම්. මානාමුදලි මිය - කථිකාචාර්ය II

18. ඩී.එම්.ඩබ්.කේ. චන්ද්‍රසිරි මහතා - පුස්තකාලයාධිපති

19. කේ.එන්. සමන්ති මෙය - සහකාර පුස්තකාලයාධිපති II

20. ක්‍රිසාන්තිනී කිට්නඝාමි මෙය - ඉංග්‍රීසි උපදේශක

(ආ) අධ්‍යයන කාර්ය මණ්ඩලය (පුහුණු අංශය)

01. වරදගෞරි වාසුදේවන් මිය - අධ්‍යක්ෂ (පුහුණු)

03. දිප්ති නිරෝෂිකා මිය - පුහුණු නිලධාරී I

04. කුමුදිනි වැදිසිංහ මිය - පුහුණු නිලධාරී II

05. බී.කේ.එස්.කරුණාරත්න මහතා - පුහුණු නිලධාරී II

06. පී.සී.හෙට්ටිආරච්චි මහතා - පුහුණු නිලධාරී II

07. ඒ.එම්.කේ.එල්.අධිකාරි මිය - පුහුණු නිලධාරී II

08. ඒ.එච්.උබයදුල්ලා මහතා - පුහුණු නිලධාරී II

| | | |
|---|---|---|
| 09. ජේ.එච්.අයි.ප්‍රසාද් මහතා | - | පුහුණු නිලධාරී II |
| 10. ටී.තර්ෂන් මහතා | - | පුහුණු නිලධාරී II |
| 11. වයි.එම්. නිම්සාත් මහතා | - | පුහුණු නිලධාරී II |
| 12. බී.ජී.අයි. මදුෂානී සමරසිංහ මිය | - | පුහුණු නිලධාරී II |

(ඇ) අධ්‍යයන කාර්ය මණ්ඩලය (පර්යේෂණ අංශය)

| | | |
|---|---|---|
| 01. එම්.එස්.එම්. අස්මියාස් මහතා | - | අධ්‍යක්ෂ (පර්යේෂණ) |
| 02. එස්. හරිහරතාමෝදරන් මයා | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී |
| 03. ජේ.කේ.පී.යූ. කිර්ති මහතා | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී |
| 04. එච්.එම්.එස්.බී. හේරත් මහතා | - | පර්යේෂණ නිලධාරී II |
| 05. බී.ඒ. නිලූකා විජේබණ්ඩාර මිය | - | පර්යේෂණ නිලධාරී II |
| 06. එච්.කේ.එස්.කේ. සිරිකුමාර මිය | - | පර්යේෂණ නිලධාරී II |
| 07. කේ.ඩබ්.ටී.කේ. කරඳවල මිය | - | පර්යේෂණ නිලධාරී II |
| 08. පී.පී.ජී.සී. සිරිවර්ධන මෙය | - | පර්යේෂණ නිලධාරී II |
| 09. ඒ.එම්. මානාමුදලි මෙය | - | පර්යේෂණ සහකාර III |
| 10. ඒ.එච්. ඉන්දික සංජීව මහතා | - | පර්යේෂණ සහකාර III |
| 11. කේ.සී.කේ.ද තාබ්‍රෙව් මෙය | - | පර්යේෂණ සහකාර III |
| 12. ඒ.එරන්ති ජයවර්ණ මෙය | - | පර්යේෂණ සහකාර III |
| 13. එස්.එච්.එන්. මධුෂානි සිල්වා මෙය | - | පර්යේෂණ සහකාර III |
| 14. එන්.ඩබ්.එෆ්. චින්තක මහතා | - | පර්යේෂණ සහකාර III |

(ඇ) අනධ්‍යයන කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| 01. එල්.කේ. පුෂ්පකාන්ති මිය | - | අධ්‍යක්ෂ (පාලන හා මුදල්) |
| 02. කේ.එස්.ඩබ්. වික්‍රමසිංහ මහතා | - | ගණකාධිකාරී |
| 03. එම්.කේ. පලිහක්කාර මිය | - | පරිපාලන නිලධාරී |
| 04. සී.එච්.ඩී. හෙට්ටිආරච්චි මිය | - | ලේඛකාධිකාරී |
| 05. යූ.ඩී.ඩී. ධනුෂ්කා උස්හෙට්ටි මිය | - | අභ්‍යන්තර විගණක |

පරිපාලන අංශයේ සේවක සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

| තනතුර | අනුමත සේවක සංඛ්‍යා | ස්ථිර | ද්විතියන පදනම | අනියම් |
|---|---|---|---|---|
| 01.ගිණුම් නිලධාරී | 01 | 01 | - | - |
| 02.සහකාර ලේඛකාධිකාරී | 01 | 01 | - | - |
| 03.පරිගණක වැඩසටහන් සම්පාදක | 01 | 01 | - | - |
| 04.ව්‍යාපෘති වැඩසටහන් සම්පාදක | 01 | 01 | - | - |
| 05.කළමනාකරණ සහකාර | 34 | 33 | - | - |
| 06.නේවාසිකාගාර පාලිකා | 01 | 01 | - | - |
| 07.ශ්‍රව්‍ය දෘෂ්‍ය කාර්මික | 01 | - | - | - |
| 08.ශ්‍රව්‍ය දෘශ්‍ය සහායක | 01 | 01 | - | - |
| 09.භාෂා පරිවර්තක | 02 | 01 | - | - |
| 10.පිළිගැනීමේ නිලධාරිනි/දුරකථන ක්‍රියාකරු | 01 | 01 | - | - |
| 11.රියදුරු | 09 | 08 | - | - |
| 12.කාර්යාල කාර්ය සහායක | 15 | 14 | - | - |
| 13.වැඩසටහන් සහකාර (ස්ථානභාර) | 04 | 03 | - | - |
| 14.මුරකරු | 01 | 01 | - | - |

විදේශ ශිෂ්‍යත්ව හා පුහුණු වීම් සඳහා සහභාගී වූ නිලධාරින්

01. ශාමිලා සිවකුමාරන් මිය - අයර්ලන්තය
Joint World Conference on Social Work, Education and Social Development
2018.07.04-2018.07.07

02. වී. වාසුදේවන් මිය - ඉන්දියාව
1st International Conference on Social Responsibility of Educational Institutions in Developing Countries (ICSEDC)
2018.08.24 – 2018.08.25

03. එස්. හැරිහරතමෝදරන් මහතා - තායිලන්තය
Asia – Pacific Regional Expert Group Meeting on Reviewing Implementation of Commitments from the Asia Pacific Intergovernmental Meeting on HIV and AIDS beyond 2015".
2018.11.26 – 2018.11.28

04. එම්.ටී.ආර්.එස්. අත්තනායක මිය - තායිලන්තය
"Fifth Session of the Committee on Social Development"
2018.11.28-2018.11.30

05. එම්.ටී.ආර්. ෂාමිණී අත්තනායක මිය- ඉන්දියාව
ඉන්දියාවේ ටාටා ආයතනයේ අත්දැකීම් හුවමාරු කර ගැනීමේ හා මුම්බායි නගරයේ ආදර්ශ ගම්මාන නැරඹීමේ විදේශ චාරිකාව
**2018.12.11 - 2018.12.17**

06. කේ.එම්.වයි. කරුණාරත්න මහතා - - එම -

07. වී. වාසුදේවන් මිය - - එම -

08. එම්.එස්.එම්. අස්මියාස් මහතා - - එම -

09. සී.එච්.ඩී. හෙට්ටිආරච්චි මිය - - එම -

10. වී. ජෙයරූබන් මහතා - - එම -

11. මංජුලා විජේසේකර මිය - - එම -

12. කේ.පී. දීප්ති නිරෝෂිකා මිය - - එම -

13. කීර්ති ජයවර්ධන මහතා - - එම -

දේශීය පුහුණුවීම් සඳහා සහභාගී වූ නිලධාරීන්

01. ඩබ්.ඒ.එස්.වී.ලක්මාලි මිය - නිවාඩු ලිපිකරුගේ කාර්යභාරය හා වගකීම පිළිබඳ පුහුණුව
SDFL ආයතනය - **2018.03.19 - 2018.03.20**

02. එල්.කේ.පුෂ්පකාන්ති මිය - මූලික විමර්ශනය පිළිබඳ පුහුණු වැඩමුළුව
ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය - **2018.08.07- 2018.08.08**

03. වයි.මඩවලගේ මිය - සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවක භාර අරමුදල් ගණනය කිරීම සහ ගිණුම්ගත කිරීම සම්බන්ධ වැඩමුළුව
නිපුණතා සංවර්ධන අරමුදල - **2018.08.28**

04. යූ.ඩී.ඩී.උස්හෙට්ටි මිය - AAT ආයතනය මඟින් පවත්වනු ලැබූ වාර්ෂික සමුළුව 2018
**2018.10.15 - 2018.10.16**

05. වසන්ත කුමාර චන්ද්‍රසිරි මයා - පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් පවත්වනු ලැබූ පුහුණුව - **2018.10.16**

06. ඉන්දික විජේරත්න මහතා - - එම -

# සමාජ සේවා විද්‍යාලය

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ, සමාජ සේවා විද්‍යාලය වෘත්තීය සමාජ වැඩ පිළිබඳ උපාධි හා ඩිප්ලෝමා ක්‍රියාත්මක කරනු ලබන අධ්‍යයන අංශයයි.

**සමාජ සේවා විද්‍යාලය මඟින් පවත්වනු ලබන වෘත්තීය සමාජ වැඩ පාඨමාලාවන්**

1. සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (ද්වෛවාර්ෂික - ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ මාධ්‍යය)
2. සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව (සිව්වාර්ෂික - ඉංග්‍රීසි මාධ්‍යය)
3. සමාජ වැඩ පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (ද්වෛවාර්ෂික- සිංහල සහ දෙමළ මාධ්‍යය)
4. සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - (එක්අවුරුදු - සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යය)
5. කාන්තාවන් සවිබලගැන්වීමේ ඩිප්ලෝමා පාඨමාලාව (එක් අවුරුදු - සිංහල හා දෙමළ මාධ්‍යය)
6. සංඥා භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (එක් අවුරුදු - සිංහල හා දෙමළ මාධ්‍යය)

**අරමුණු හා පරමාර්ථ**

**පරමාර්ථ**

ශ්‍රී ලංකාවේ සමාජ වැඩ අධ්‍යාපනයේ විශිෂ්ඨ මධ්‍යස්ථානයක් බවට පත් වීම

**අරමුණු**

1. සමාජ වැඩ අධ්‍යාපනය පිළිබඳ නව වැඩසටහන් හඳුන්වා දීම
2. දැනට ක්‍රියාත්මක අධ්‍යයන වැඩසටහන් උසස් කිරීම.
3. සමාජ වැඩ අධ්‍යාපනය තුළ තොරතුරු තාක්ෂණය හා ඉංග්‍රීසි භාෂාව භාවිතා කිරීම.
4. සමාජ වැඩ අධ්‍යාපනය සඳහා ගුණාත්මක පිළිගැනීමක් ලබා ගැනීම සඳහා කටයුතු කිරීම.
5. වෘත්තීය පිළිගැනීම අත්කරගැනීම.
6. වෘත්තීය සමාජ වැඩකරුවන් බිහි කිරීම.



# සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය



## හැඳින්වීම

සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ අරමුණු වනුයේ වෘත්තීමය සුදුසුකම් සහ කළමනාකාරීත්ව නිපුණතාවයකින් හෙබි පුහුණු මිනිස් බලය සමාජ සුභසාධන පද්ධතිය සඳහා නිපදවීමත් ඒ තුළින් සමාජ සංවර්ධනය දිරිගැන්වීමත්ය. මෙම වැඩසටහන නිර්මාණය කොට ඇත්තේ සමාජ වැඩ පිළිබඳ උසස් දැනුමත්, ප්‍රායෝගික පුහුණුවීම් ආදිය මූලික කරගෙන සහභාගිවන්නන් තුළ ආකල්පමය වෙනසක් ඇති කිරීම තුළින් ඔවුන් සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ නියමුවන් ලෙස ප්‍රතිපත්ති සැළසුම් කිරීමේදි ඔවුන්ගේ සක්‍රීය දායකත්වය ලබාගැනීම සඳහාය.

**සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධිය සඳහා ඇතුළත්වීමේ සුදුසුකම්**

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් පිරිනමන ලද ප්‍රථම පන්තියේ හෝ දෙවන පන්තියේ උපාධිය

  *හෝ*

- සාමාන්‍ය පන්තියේ උපාධිය සමඟ එක් අවුරුදු පශ්චාත් උපාධි ඩිප්ලෝමා

  හෝ

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උසස් අධ්‍යයන ආයතනයකින් ලබාගත් ප්‍රථම උපාධිය සහ උපාධිය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර 3 ක සමාජ සුභසාධන සංවිධානයක කටයුතු කිරීමේ පළපුරුද්ද

  හෝ

- ආයතනයේ අධ්‍යයන කටයුතු මණ්ඩලය විසින් නිර්දේශ කරන ප්‍රථම උපාධියට සමානවන වෙනත් වෘත්තීය සුදුකමක් ලබා තිබීම හා එම සුදුසුකම් ලැබීමෙන් පසු සමාජ සුභසාධන ක්ෂේත්‍රයේ වසර 3ක පළපුරුද්ද

  සහ

- ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා දැනුමක් ලබා තිබීම.

## සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන - 2018 වර්ෂය සඳහා අදාළ ක්‍රියාකාරකම්

### 2018/2019 ඉංග්‍රීසි මාධ්‍යය සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ සමාරම්භක උත්සවය

සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව 2018/2019 (ඉංග්‍රීසි මාධ්‍යය) 2018 වසරේ මැයි 04 වන දින ජාතික සමාජ සංවර්ධන ආයතනයේ දී ආරම්භ විය. මෙම වැඩසටහන සම්පාදනය කිරීම තුළින්, සමාජ වැඩ පිළිබඳ උසස් ප්‍රාගුණ්‍යයක් ශිෂ්‍යයන් හට ලබා දීම තුළින්, ගුණාත්මක දැනුම ප්‍රවර්ධනය කොට ශිෂ්‍යයන් තුළ ගුණාත්මක වෙනසක් ඇති කිරීම අපේක්ෂා කෙරේ. විශේෂයෙන්ම, විශ්ලේෂණාත්මක කුසලතා, තාර්කික ඇගයුම් ක්‍රම, හා දැනුම විවේචනාත්මකව විග්‍රහ කර ගැනීමට ශිෂ්‍යයා පුහුණු කිරීම තුළින් මෙම වෙනස අත්පත් කරගැනීමට අපේක්ෂිතය. මේ තුළින්, අවධානයේ දූරදර්ශී නායකත්වයන්, පරිචයේ නිපුනත්වය තුළින් කළමානාකරණ මට්ටමේ සේවයේ නියුතු පුද්ගලයන්ගේ සේවාව තුළ වෙනසක් ඇතිකිරීමට අපේක්ෂිතය.

### 2018/2019 සිංහල හා දෙමළ මාධ්‍යය සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ සමාරම්භක උත්සවය

සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (සිංහල හා දෙමළ මාධ්‍යය) ආරම්භක වැඩසටහන 2018 ඔක්තෝම්බර් මස 12 වන දින පැවැත්විය. මේ සඳහා ආයතනයේ අධ්‍යක්‍ෂ ජනරාල් (ආවරණ) සහ අනෙකුත් අංශයන් ගේ ප්‍රධානීන් ගේ සහභාගීත්වයෙන් සිදුවිය. මෙම වැඩසටහන 2008 දී ප්‍රථම වරට ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් ආරම්භ වූ අතර, ඉතිහාසයේ ප්‍රථම වතාවට සිංහල හා දෙමළ මාධ්‍යය සිසුන් සඳහා අවස්ථාව උදාකරමින් අදාළ මාධ්‍යයන් දෙකෙන් ආරම්භවිය.



# සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය



## හැඳින්වීම

සමාජ වැඩ පිළිබඳ උපාධිය වසර 4 ක පූර්ණකාලීන පාඨමාලාවකි. එය සමාසික 08 කින් සමන්විත අතර, පංති කාමර දේශන හා සමගාමී ක්ෂේත්‍ර පුහුණුවීම් තුනකින් යුක්ත වේ. විශේෂයෙන්ම සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධිය ශ්‍රී ලංකාවේ ඇති අනෙකුත් විශ්වවිද්‍යාලවලින් පවත්වනු ලබන උපාධි පාඨමාලාවලට වඩා සුවිශේෂී වන්නේ න්‍යායාත්මක දැනුම පමණක් නොව ප්‍රායෝගික පුහුණුවීම්වලින් ද යුක්ත වන නිසයි. එසේ වන්නේ පංති කාමර දේශන අතරතුරදීම ශිෂ්‍යයින්ගේ දැනුම, ආකල්ප වෙනස් කිරීම සඳහා ක්ෂේත්‍ර ගත පුහුණුවීම්වලට ශිෂ්‍යයින් අනුයුක්ත කරන අතර, ක්ෂේත්‍ර අධීක්ෂකවරුන්ගේ සහ පීඨ අධීක්ෂකවරුන්ගේ මඟපෙන්වීම, උපදෙස් මත ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් දියත් කරනු ලබන බැවින්ය.

මෙම ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවේ විෂය නිර්දේශය සමාජීය විද්‍යාවන්ගේ විෂය අන්තර්ගතයන් මෙන්ම සමාජ වැඩවලට පමණක් සුවිශේෂී වූ ක්‍රමෝපායන්වලින් යුක්ත වන අතර, සිසුන්ට ඒ පිළිබඳ පුළුල් දැනුමක් ලබා දෙනු ලබයි. එමෙන්ම ක්ෂේත්‍ර පුහුණුවීම් මඟින් ප්‍රජා ක්‍රියාකාරකම් සිසුන් විසින් කළ යුතු අතර, එම ක්‍රියාකාරකම් අලලා වාර්තා සකස් කිරීම අනිවාර්යය වේ. මීට අමතරව සිසුන් විසින් පර්යේෂණයක් සිදුකර එහි සඳහන් වන නිගමනයන්ට අනුව ක්‍රියාකාරකම් සැළසුම් කර දියත් කළ යුතු අතර, පර්යේෂණ වාර්තාවක් ද එමඟින් සකස් කළ යුතුය.

මෙම උපාධි පාඨමාලාවේ සුවිශේෂත්වය වන්නේ න්‍යායාත්මක දැනුම ලබා දෙනු ලබන පැය ගණනට වඩා වැඩි පැය ගණනක් ක්ෂේත්‍ර පුහුණුවීම් සඳහා යොදවා ඇති බැවිනි.

පාඨමාලාව සඳහා බඳවාගැනීමේ මූලික සුදුසුකම ලෙස සැලකෙන්නේ විශ්වවිද්‍යාලයට ඇතුලත් වීමේ අවම සුදුසුකම සහිතව අ.පො.ස උසස් පෙළ විභාගය සමත් වීමයි. එම සුදුසුකම්ලත් අයදුම්කරුවන් ආයතනය විසින් පවත්වනු ලබන ඇතුළත්වීමේ විභාගයකට හා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටිය යුතු අතර, එයින් සමත් වන සිසුන් උපාධි පාඨමාලාවට ඇතුළත් කරගනු ලබයි.

සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධිය 2013 වර්ෂයේ සිට සිංහල, ඉංග්‍රීසි, දමිළ යන භාෂා මාධ්‍යය තුනෙන්ම පවත්වනු ලබයි.

## සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධි වැඩසටහන - 2018 වර්ෂය සඳහා අදාළ ක්‍රියාකාරකම්

### 2018 - උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වීම



වර්ෂ 2018, මාර්තු මස 29 වන දින වාර්ෂික උපාධි ප්‍රධානෝත්සවය, බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයේ රැස්වීම් ශාලා - බී ස්ථානයේ පෙ.ව. 09.30 ට සුභසාධන හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ගරු අමාත්‍ය එස්.බී. දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් සහ, අමාත්‍යාංශයේ ලේකම් ශිරාණි වීරකෝන් මහත්මිය (ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පාලක සභාවේ සභාපති) සහ ජාතික සමාජ සංවර්ධන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය රිඩ්ලි ජයසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් සෙසු ආරධිත අමුත්තන්ගේද සහභාගිත්වයෙන් පැවත්විණි. මෙහි ප්‍රධාන දේශනය විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති, මාහාචාර්ය පී.එස්.එම්. ගුණරත්න මහතා විසින් සිදුකරන ලදි. සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය සහ සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සාර්ථකව අවසන් කල උපාධිධරයන් 93 දෙනෙකු හට මෙහිදී උපාධිය පිරිනමන ලදි.

මානව වාසභූමි වල සේවා සැපයුම - 2018, නාච්චදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, අනුරාධපුර දිස්ත්‍රික්කය

මානව වාසභූමි වල ජීවත්වන මිනිසුන්ගේ ජීවන රටාව හා අත්දැකීම් එලෙසම ලබාගැනීමේ අපේක්ෂාවෙන් මෙම අධ්‍යයන වැඩසටහන සමාජ සේවා විද්‍යාලය මඟින් පවත්වාගෙන යනු ලබයි. සමාජ වැඩ පිළිබඳ උපාධිය හදාරන 2015/2019 ශිෂ්‍ය කණ්ඩායම දින 10ක මානව වාසභූමි වල සේවා සැපයුම පිළිබඳ අධ්‍යයනය අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නාච්චදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අනුයුක්ත ග්‍රාම නිලධාරී වසම් තුළ සිදු කරන ලදී. මෙහි මූලික අරමුණ වනුයේ අදාල සේවාවන්හී නිවැරදි, තත්‍ය ස්වභාවය එලෙසම සිසුන් විසින් අත්දකිනු ලැබීමයි. මේ තුළින් ග්‍රාමීය ජීවිත කෙරෙහි ප්‍රවේශයක් සිසුන් විසින් ලබාගන්නා අතරම, සමාජ සංවර්ධනයට බාධා පමුණුවන ප්‍රශ්න හා අර්බුද පිළිබඳ පැහැදිලි අවබෝධයක් ද ලබාගැනේ. තෝරාගත් ග්‍රාම නිලධාරී වසම් 19 ක සමාජ වැඩ ශිෂ්‍යයන් 88 දෙනෙක් ස්ථානගත කරන ලද අතර, ශිෂ්‍යයන් විසින් ප්‍රජා ගැටලු හා සේවා සැපයුම පිළිබඳව අධ්‍යයනය කරන ලදි. තවද සිසුන් මෙම ප්‍රදේශයේ වෘත්තීය සමාජ වැඩකරුවන්ගේ භූමිකාව හා අවශ්‍යතාව පිළිබඳව අධ්‍යයනක යෙදුණි.



සිංහල හා හින්දු අලුත් අවුරුදු සැමරුම

සමාජ සේවා විද්‍යාලයේ අධ්‍යාපනය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් සංවිධානය කරනු ලැබූ "සූර්ය ප්‍රාප්තිය" නව අවුරුදු උළෙල 2018 වර්ෂයේ මැයි 11 වන දින වැලිකඩ බන්ධනාගාර ක්‍රීඩාංගනයේ දී පැවත්විය.



### සමාජ වැඩ ශිෂයයන් තුළ ප්‍රත්‍යස්ථතාව ගොඩනැගීම පිළිබඳ වැඩමුළුව

සමාජ වැඩ ශිෂයයන් තුළ ප්‍රත්‍යස්ථතාව ගොඩනැගීම පිළිබඳ වැඩමුළුව 2018 වර්ෂයේ ජුනි මස 11 වන දින සමාජ වැඩ උපාධි හදාරන සහ සමාජ වැඩ ඩිප්ලෝමාව හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් මෙම වැඩමුළුව කොළඹ විශ්ව විද්‍යාලයේ ආචාර්ය මහීස් මොහොමඩ් මහතා සහ සායනික මනෝවිද්‍යා රොෂාන් ධම්පාල මහත්මියගේ මෙහෙයවීමෙන් පැවැත්වුණි.




### සමාජ වැඩ පිළිබඳ උපාධිය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ - දෙමාපිය හමුව

2017/2018 සහ 2016/2020 අධ්‍යයන වර්ෂයන්හී අධ්‍යාපනය ලබන විද්‍යාර්ථීන්ගේ දෙමාපියන්ගේ හමුව ආයතනයේ ප්‍රධාන ශ්‍රවණාගාරයේදී 2018 ජුනි මස 29 වන දින පැවැත්වුණි. මෙම වැඩසටහනෙහි මූලික අරමුණ වූයේ ශිෂ්‍යයන්, දෙමාපියන් සහ අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන් අතර පවත්නා සම්බන්ධතාව ශක්තිමත් කිරීම තුළින් ශිෂ්‍යයන් ආයතනය සමඟ ගනුදෙනු කරන කාලසීමාව තුළ අවශ්‍ය අධ්‍යාපනය, රැකවරණය හා ආරක්ෂාව ඇතුළු අනෙකුත් පහසුකම් සැපයීමයි. මෙහිදී දෙමාපියන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා හා නිගමන වාර්තාගත කරන ලදී.

### වාර්ෂික පිරිත් පිංකම

ආයතනයේ වාර්ෂික පිරිත් පිංකම් වැඩසටහන 2016/2020 සමාජ වැඩ ශිෂ්‍ය කණ්ඩායම විසින් 2018 ජුනි මස 31 වන දින සහ 2018 ජුලි මස 01 වන දින ආයතන පරිශ්‍රයේදී පවත්වන ලදී.



## ඉෆ්තාර් වැඩසටහන

සමාජ සේවා විද්‍යාලයේ මුස්ලිම් ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කරනු ලැබූ ඉෆ්තාර් වැඩසටහන 2018 ජුලි 07 වන දින ආයතනයේදී පවත්වන ලදී.



## සමාජ වැඩ පිළිබඳ උපාධිය - නවක ශිෂ්‍ය කණ්ඩායම අධ්‍යයන වර්ෂය 2018/2019

2018 ජුලි මස 30 වන දින සමාජ වැඩ පිළිබඳ නවක ශිෂ්‍ය කණ්ඩායම් අධ්‍යයන කටයුතු ආරම්භ විය. මෙසේ බඳවාගනු ලැබූ සිසුන් 64 දෙනෙකු ප්‍රථමයෙන්ම ඉංග්‍රිසි භාෂාව පිළිබඳ මසක අනුස්ථාපන වැඩසටහනකින් පසු සිය පළමු අධ්‍යයන සමාසිකය අවසානයේ යාපනය ප්‍රදේශය ආශ්‍රිතව සංවිධානය කළ දින 05ක ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් සඳහා ද සම්බන්ධ විය.



## ලෝක ගුරුදින සැමරුම් උත්සවය

2018 වර්ෂයේ 08 වන දින ලෝක ගුරු දිනය, 2018/2019 අධ්‍යයන වර්ෂයේ උපාධිය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ මූලිකත්වයෙන් සංවිධානය විය. මෙහි දී ශිෂ්‍යයන් ආයතනයේ පීඨ මණ්ඩලයේ කැපවීම හා සමාජ වැඩ අධ්‍යාපනය වෙනුවෙන් සිදුකරන මෙහෙය ඇගයීමකට ලක්කරන ලදී.





## සරස්වතී පූජා සැමරුම් වැඩසටහන

මෙම වැඩසටහන 2018 වර්ෂයේ ඔක්තෝම්බර් 15 වන දින 2017 /2018 සමාජ වැඩ විද්‍යාර්ථීන්ගේ අනුග්‍රහයෙන් ආයතන පරිශ්‍රය තුළ සංවිධානය විය. මෙම වැඩසටහන දැනුම, කුසලතා හා කලාවට අධිපතිනිය ලෙස සැලකෙන සරස්වතී දේවිය උපදෙසා වාර්ෂිකව ආයතනය තුල සංවිධානය වන සංස්කෘතික සැමරුම් උත්සවයකි.



## මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සමාජ වැඩ පිළිබඳ උපාධිය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ 2017/2018 අධ්‍යයන වර්ෂයට අදාළව තෝරාගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 09 දෙනෙකු මහපොළ ශිෂ්‍යාධාර සහතිකපත් 2018 ඔක්තෝම්බර් 29 වන දින ආයතනික ශ්‍රවණාගාරයේදී පිරිනමන ලදී.





## සමාජ වැඩ පිළිබඳ උපාධිය හදාරන - පළමු වසර සිසුන්ගේ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව

සමාජ සේවා විද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන් තුළ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීමේ අභිප්‍රායෙන් මෙම චාරිකාව සංවිධානය කරනු ලබයි. 2018/2019 අධ්‍යයන කණ්ඩායම සතියක් පුරා අනුරාධපුර හා යාපනය යන දිස්ත්‍රික්ක වල සමාජ සුභසාධන ආයතන හා ප්‍රජාවන් නිරීක්ෂණය කිරීම මෙම වැඩසටහන තුලින් සිදුවිය.




බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී සමරන ලද ලෝක මානව හිමිකම් දිනය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2018 වසරේ ලෝක මානව හිමිකම් දිනය 2018 දෙසැම්බර් 10 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී සමරන ලදී. මෙම සැමරීම සඳහා සමාජ සේවා විද්‍යාලයේ සිසුන් 20 දෙනෙකු පමණ සහභාගී වූ අතර, මේ තුළින් මානව හිමිකම් සුරක්ෂිත කිරීම සඳහා තරුණ හඬ දායක කරගැනීමට අපේක්ෂා කරන ලදී.




## සමාජ වැඩ පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව

ජාතික සමාජ සංවර්ධන ආයතනය මඟින් පවත්වනු ලබන සමාජ වැඩ උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ අරමුණ වන්නේ සමාජ සේවා, සමාජ සුභසාධන හා සමාජ සංවර්ධන ක්ෂේත්‍රයන් සඳහා අවශ්‍ය විද්‍යාත්මක දැනුම, කුසලතා හා ආකල්පවලින් පිරිපුන්, කාර්යක්ෂම මෙන්ම ගුණාත්මක අධ්‍යාපනයක් සහිත බහු ජනවාර්ගික සාමය හා සහජීවනය නංවාලිය හැකි සමාජ වැඩ වෘත්තිකයින් බිහි කිරීමයි. මෙම අධ්‍යයන වැඩසටහන සමාසික 08කින් සමන් විත දෑ අවුරුදු පාඨමාලාවකි. මෙම පාඨමාලාව පංති කාමර ඉගැන්වීම් හා ක්ෂේත්‍ර පුහුණු වීම් වලින් සමන්විත වේ. ක්ෂේත්‍ර පුහුණුවේදී සිසුන් ප්‍රජාවන් හා ආයතන සමඟ සමාජ වැඩ පරිචයෙහි යෙදෙන අතර එය වෘත්තිය සමාජ වැඩකරුවන්ගේ සමීප අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. මෙම වෘත්තීය පාඨමාලාව මඟින් පුද්ගලයින් සමඟ වැඩ කිරීමේ නිපුණතාවලින් හෙබි වෘත්තීය සමාජ වැඩ කරුවෙකු බිහි කිරීමට අපේක්ෂිතයි.

## සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන - 2018 වර්ෂය සඳහා අදාළ ක්‍රියාකාරකම්

### ඩිප්ලෝමා සහතික ප්‍රදානෝත්සවය

බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී, 2018 මාර්තු මස 21 වන දින ඩිප්ලෝමා සහතික ප්‍රධානෝත්සවය පැවත්විය. මෙහිදී ඩිප්ලෝමා සහතිකය ලබාගත් බහුතරයක් ඩිප්ලෝමාධාරීන් රාජ්‍ය සේවකයන් විය. සමාජ විඩ පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව හා සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව සාර්ථකව හැදෑරූ සිසුන් හට සහතික පත්‍ර පිරිනමන ලදී.



සමාජ වැඩ උසස් ඩිප්ලෝමා පාඨමාලා සමාරම්භක උත්සවය

2018/2019 වර්ෂය සඳහා වන සමාජ වැඩ උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2018 මාර්තු 05වන දින සිංහල හා දෙමළ මාධ්‍යයෙන් ආරම්භ කරන ලදී. මෙම පාඨමාලාව සඳහා රාජ්‍ය අංශයේ සේවක සේවිකාවන් හා රාජ්‍ය නොවන අංශයේ සේවක සේවිකාවන් කණ්ඩායමක් බඳවා ගනු ලැබීය.

## සමාජ සේවා විද්‍යාලයේ - අනෙකුත් ක්‍රියාකාරකම්

අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයන්ගේ ගුරු ශිෂ්‍ය සබඳතා ඉහල නැංවීම අරමුණ කරගනිමින් සංවිධානය කරන ලද වැඩමුළුව

2018 වර්ෂයේ මාර්තු මස 28 වන දින මෙම වැඩසටහන පීඨ මණ්ඩල සාමාජිකයින් උදෙසා පවත්වන ලද අතර, මෙමඟින් අවධානම් සහිත සිසුන් හඳුනාගැනීම ඔවුන් සුදුසු ඉදිරි ප්‍රතිකාරාත්මක හෝ උචිත ක්‍රියාමාර්ග උදෙසා යොමුකිරීම පිළිබඳ සාකච්ඡා කරන ලදී. සායනික මනෝ විද්‍යාඥ රොශාන් ධම්පාල මහත්මිය විසින් වැඩසටහන මෙහෙයවන ලදී.




## ජාත්‍යන්තර සම්මන්ත්‍රණය 2018

සමාජ සේවා විද්‍යාලයේ කථිකාචාර්ය, ශාමිලා සිවකුමාරන් මහත්මිය අන්තර්ජාතික සමාජ වැඩ සංගමය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලැබූ ජාත්‍යන්තර සමාජ වැඩ සම්මන්ත්‍රණය සඳහා සහභාගී වීමට පූර්ණ ශිෂ්‍යත්වයක් ලබා ගැනීමට සමත්විය. මෙම ජාත්‍යන්තර සම්මන්ත්‍රණය අයර්ලන්තයේ ඩබ්ලින් අගනුවර 2018 වර්ෂයේ ජුලි මස 04 වන දින සිට 07 වන දින දක්වා පැවත්විය. ඇය විසින් ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍රිකාව "ශ්‍රී ලංකාවේ පුද්ගලයින් විසින් මුහුණ දෙන අවාසිදායක තත්ත්වයන්ගෙන් මුදවාගැනීමට අධ්‍යාපනයේ දායකත්වය" මැයෙන් විය.






**වෙස්ටර්න් සිඩ්නි විශ්ව විද්‍යාලයේ (ඔස්ට්‍රේලියාව) සමාජ විද්‍යා හා මනෝ විද්‍යා අංශයේ මහාචාර්ය, බ්‍රයන් ස්ට්වුට් මහතා සමඟ පැවත්වූ සාකච්ඡාව**





වෙස්ටර්න් සිඩ්නි විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා හා මනෝවිද්‍යා අංශයෙහි පීඨාධිපති වශයෙන් කටයුතු කරන බ්‍රයන් ස්ට්වුට් මහතා සමඟ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තුමිය සහ සමාජ සේවා විද්‍යාලයේ අධ්‍යක්ෂක තුමා ඇතුළු පීඨ මණ්ඩල සාමාජිකයින් සමඟ පවත්වන ලද සාකච්ඡාව ඉදිරි ආයතනික ප්‍රවර්ධනයට හා ශිෂ්‍ය හුවමාරුවට දායක කරගත හැකි ආකාරය පිළිබඳ විමසුමකට ලක්කරන ලදී.

### සමාජ වැඩ උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණය

සමාජ වැඩ උපාධිය නිල වශයෙන් ආරම්භ කිරීම 2005 දී සිදු වූ අතර එතැන් සිට සිසුන් 474 කට ආසන්න සංඛ්‍යාවක් සමාජ වැඩ විද්‍යාලයෙන් උපාධි ලබා ඇත. මෙලෙස සමාජ වැඩ උපාධිය සම්පූර්ණ කරන ලද සිසුන්, රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පෞද්ගලික අංශයේ ඍජු සහ වක්‍ර සමාජ වැඩ, සමාජ සේවා හා සමාජ සුභසාධන කාර්යන්හි නිරත වෙමින් සමාජ සංවර්ධනයට අවශ්‍ය දායකත්වය සපයනු ලැබේ. සමාජ වැඩ උපාධිධාරීන්ගේ රැකියාගත ක්ෂේත්‍රයන් පහත පරිදි දැක්විය හැක.

- රාජ්‍ය අංශය -

- කථිකාචාර්ය/උපදේශක සමාජ වැඩ වෛද්‍ය පීඨය කොළඹ විශ්වවිද්‍යාලය ජ්‍යෙෂ්ඨ නිලධාරී
- සංවර්ධන සහකාර
- පරිවාස නිලධාරී
- ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී
- උපදේශක
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය
- ගුරුවෘත්තීය
- මනෝචිකිත්සක සමාජ වැඩකරු

➢ රාජ්‍ය නොවන සංවිධාන : ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ දේශීය රාජ්‍ය නොවන සංවිධාන (UN/Save the Children/CEPA/SAP Sri Lanka/Care International etc.)

- ව්‍යාපෘති කළමනාකරුවන් / නිලධාරී
- වැඩසටහන් නිලධාරී
- මනෝ උපදේශකවරු

➢ පෞද්ගලික අංශය: ආයතනික සමාජ වගකීම් කළමනාකරු

- මනෝ උපදේශකවරු
- මානව සම්පත් කළමනාකරුවන්/නිලධාරී

මීට අමතරව NORAD, AUS/AID සහ පොදුරාජ්‍ය මණ්ඩලීය, කැනේඩියානු සහ ඉන්දියානු රජයෙන් පිරිනැමෙන ශිෂ්‍යත්ව සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධිධාරීන් විසින් ලබා ගෙන ඇත.

**සමාජ වැඩ උපාධිධාරීන්ගේ සේවා නියුක්ති සමීක්ෂණය - 2018**

**2018 වසර දක්වා උපාධි ලබාගත් සිසුන් ගණන**

| | | |
|---|---|---|
| අධ්‍යයන වර්ෂය - 2005/2009 | - | 18 |
| අධ්‍යයන වර්ෂය - 2006/2010 | - | 53 |
| අධ්‍යයන වර්ෂය - 2007/2011 | - | 28 |
| අධ්‍යයන වර්ෂය - 2008/2012 | - | 35 |
| අධ්‍යයන වර්ෂය - 2009/2013 | - | 37 |
| අධ්‍යයන වර්ෂය - 2010/2014 | - | 38 |
| අධ්‍යයන වර්ෂය - 2011/2015 | - | 44 |
| අධ්‍යයන වර්ෂය - 2012/2016 | - | 34 |
| අධ්‍යයන වර්ෂය - 2013/2017 | - | 86 |
| අධ්‍යයන වර්ෂය - 2014/2018 | - | 101 |
| එකතුව | = | **474** |




**සේවානියුක්ත ශිෂ්‍ය සංඛ්‍යාව - 410 (86.50%)**

| ක්ෂේත්‍රය | ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| රාජ්‍ය අංශය | 82 | (17.30%) |
| ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන / රාජ්‍ය නොවන සංවිධාන | 207 | (43.67%) |
| විදේශ රැකියා | 34 | (7.17%) |
| පෞද්ගලික අංශය | 65 | (13.71%) |
| නිදහස් රැකියා (Freelance) | 16 | (3.38%) |
| නීති ක්ෂේත්‍රය | 6 | (1.27%) |

රැකියා වියුක්තිය

| | | |
|---|---|---|
| රැකියා වියුක්ති සිසුන් | **64** | **(13.50%)** |


රැකියා නියුක්තිය පිළිබඳ තොරතුරු
රැකියා නියුක්ත සංඛ්‍යාව
250
200
150
100
50
0
රාජ්‍ය අංශය
ජාත්‍යන්තර රාජ්‍ය නොවන...
විදේශ රැකියා
පෞද්ගලික අංශය
නිදහස් රැකියා(Freelance)
නීති ක්ෂේත්‍රය
රැකියා වියුක්ති සියුන්
රැකියා නියුක්ත අංශ


අංශයන් අනුව රැකියා නියුක්ත ප්‍රතිශතය
1%
4%
20%
16%
8%
51%
රාජ්‍ය අංශය
ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන / රාජ්‍ය නොවන සංවිධාන
විදේශ රැකියා
පෞද්ගලික අංශය
නිදහස් රැකියා(Freelance)
නීති ක්ෂේත්‍රය

# පුහුණු අංශය



## හැඳින්වීම

2004 වර්ෂයේදී ස්ථාපනය කරනු ලැබූ පුහුණු අංශය, ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ආයතනික ව්‍යුහයේ ප්‍රධාන අංශ හතර අතුරින් එකක් වශයෙන් හැඳින්විය හැකිය. මෙම අංශය, ප්‍රධාන වශයෙන් පුහුණු කිරීමේ අධ්‍යක්ෂකවරයෙකු යටතේ ක්‍රියාත්මක වේ. 2018 වර්ෂය තුළ එක් පළමු ශ්‍රේණියේ පුහුණු කිරීමේ නිළධාරිනියක් සහ දෙවන ශ්‍රේණියේ පුහුණු කිරීමේ නිළධාරීන් / නිළධාරිනියන් 09 දෙනෙකු මෙම අංශය තුළ සේවය කරනු ලබයි. මීට අමතරව කළමණාකාර සහකාර I එක් නිළධාරිනියක්ද, කළමණාකාර සහකාර II නිළධාරිනියන් දෙදෙනෙකුද, කළමණාකාර සහකාර III එක් නිළධාරිනියක්ද මීට අමතරව කාර්යාල සහායකවරයෙකු මෙම අංශයට අනුයුක්තව සේවය කරයි.

1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතන පනතට අනුව පුහුණු අංශයට පැවරී ඇති වගකීම් වනුයේ,

- සමාජ සුභසාධන ක්‍රම සහ සමාජ සංවර්ධන වැඩසටහන් පිළිබඳ අධ්‍යයන කටයුතු පැවැත්වීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීම
- සමාජ වැඩ වලදී තාක්ෂණය උපයෝගී කරගැනීම ඇතුලුව සමාජ වැඩ සහ සමාජ සංවර්ධන අධ්‍යාපන ක්‍රමයෙහි නිර්මාණාත්මක පරිචයක් ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම
- ඒ සමාන අරමුණු ඇති වෙනත් ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම
- සමාජ සුභසාධනයෙහි නිරත නිලධාරීන් සහ වෙනත් කාර්ය මණ්ඩල සඳහා පුහුණුවීමේ පාඨමාලා සහ ශික්ෂණ වැඩසටහන් පවත්වාගෙන යාම

සමාජ සවිබලගැන්වීම්, සුභසාධන සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය මගින් යොමු කරනු ලබන අදාළ අංශයන්හී කාර්ය මණ්ඩල හා සේවාලාභීන් සඳහා සමාජ සංවර්ධනය පදනම් කරගත් තේමාවන් පිළිබඳ පුහුණුව ලබාදීම ද මෙම අංශය මගින් සිදුකරනු ලබයි. එපමණක් නොව සංවර්ධනය හා සම්බන්ධ ක්ෂේත්‍රයන් හා බැඳුනු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර,වෙනත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සඳහාද පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලබයි. එසේම පුහුණු අංශය වෙත බාහිර ආයතන මගින්ද පුහුණු වැඩසටහන් සඳහා බොහෝ ඉල්ලීම් ලැබේ. එබැවින් පුහුණු අංශය පුහුණු කිරීමේ වැඩසටහන් ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන හා ඒ ආශ්‍රිත ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් සංවිධානය කරනු ලැබේ.

**පුහුණු අංශයේ අරමුණු :**

- විවිධ ක්ෂේත්‍රයන්හී සහ අදාළ අංශයන්හී පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම
- රටෙහි පුහුණු අවශ්‍යතා හඳුනා ගනිමින් ඊට අනුකූල වන පරිදි මානව සම්පත් පුහුණු කිරීම
- අවශ්‍යතා තක්සේරුව මගින් පුහුණු අවශ්‍යතා සහිත අංශ හඳුනා ගැනීම
- සේවාලාභීන්ගේ අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි පුහුණු වැඩසටහන් සංවිධානය සහ ක්‍රියාත්මක කිරීම
- පුහුණු වැඩසටහන් වලට අදාළ පාඨමාලා අන්තර්ගතයන් සංවර්ධනය කිරීම සහ යාවත්කාලීන කිරීම

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය මගින් පුළුල් ක්ෂේත්‍ර ගණනාවක් පදනම් කරගනිමින් පුහුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කරනු ලැබේ. එහිදී දීර්ඝ කාලීන සහ කෙටි කාලීන පුහුණු වැඩසටහන් සහ පාඨමාලාවන් මෙන්ම අනෙකුත් වෘත්තිය පාඨමාලාද සංවිධානය කරනු ලැබේ. ඒ අතර සංවිධානය කරනු ලබන දීර්ඝ කාලීන පුහුණු වැඩසටහන් පහත ආකාර වේ.

- උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව
- උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- ළමා ආරක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- සමාජ රැකවරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව
- ප්‍රජාපාදක විශෝධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

පුහුණු අංශය මගින් අවශ්‍යතාවය මත පදනම්ව පහත ආකාරයේ කෙටිකාලීන පුහුණු වැඩසටහන්ද සංවිධානය කරනු ලැබේ.

- මූලික උපදේශනය
- මූලික මනෝ විද්‍යා උපදේශනය
- සමාජ වැඩ මැදිහත්වීම
- ආතති කළමණාකරණය
- ගැටුම් කළමණාකරණය සහ සාමය පිළිබඳ අධ්‍යාපනය
- ළමා සංවර්ධනය, ළමා අපයෝජනය සහ ළමා අපචාර
- ව්‍යාපෘති යෝජනා පත්‍ර සැකසීම
- ආපදා කළමණාකරණය
- නිවාස පදනම් කරගත් පූර්ව ළමා විය සංවර්ධනය
- නායකත්ව සහ සන්නිවේදන කුසලතා
- සිද්ධි කළමණාකරණය

එසේම පහත ආකාරයේ අතුරු වෘත්තිය පාඨමාලාද මෙම අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබයි

- ප්‍රජා මූල සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන සඳහා වූ ධාරිතාව ගොඩනැවීමේ පුහුණු වැඩසටහන

# 2018 වර්ෂය තුළ පුහුණු අංශය මගින් පැවැත්වූ පාඨමාලා සහ පුහුණු වැඩසටහන්

## ඩිප්ලෝමා පාඨමාලා

### *1. උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව*

**හැඳින්වීම**

උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව, සති අන්ත අධ්‍යයන පාඨමාලාවක් වශයෙන් ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම ඩිප්ලෝමා පාඨමාලාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතීකන නිර්දේශයන්ට අනුකූල වන පරිදි කොළඹ මධ්‍යස්ථානය කේන්ද්‍ර කරගනිමින් සැලසුම්කොට පවත්වාගෙන යයි.

**ඉලක්කය:**

දැනුම, කුසලතා, ආකල්ප සහ මානසික සැකැස්ම සහිත මනා පරිචයන්ගෙන් යුතු වෘත්තීය උපදේශකවරුන් බිහිකිරීම

**අරමුණු:**

- උපදේශන ක්ෂේත්‍රය සඳහා ගුණාත්මක බවින් හෙබි වෘත්තිකයන් බිහිකිරීම
- උපදේශන වෘත්තිකයන්ගේ උසස් වෘත්තීය කුසලතා පුළුල් කිරීම
- උපදේශන වෘත්තිකයාගේ මැදිහත්වීමේ හැකියාව වර්ධනය කිරීම

මාධ්‍යය

සිංහල සහ දෙමළ

**කාල සීමාව**

මාස 21කි. මෙම පාඨමාලාවෙහි මාස 03ක උපදේශන පුහුණුවක් අන්තර්ගත වේ. (සති අන්ත පාඨමාලාවකි)

පාඨමාලා ව්‍යුහය(සම්පූර්ණ සම්මාන ඒකක (credit) 30කි, දේශන - පැය 405 සහ ක්ෂේත්‍ර පුහුණුව - පැය 150). ඒ අනුව මුලු පැය ගණන පැය 555කි.

උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව පාඨමාලා ඒකක 09 සහ ක්ෂේත්‍ර පුහුණුව

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ කොළඹ ප්‍රධාන මධ්‍යස්ථානය කේන්ද්‍ර කොට ගනිමින් 2018 වර්ෂය තුළදී මෙම පාඨමාලාව පවත්වා ඇත.

## *2. උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා*



**හැඳින්වීම**

**උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය විසින් සති අන්ත අධ්‍යයන පාඨමාලාවක් වශයෙන් පිරිනමනු ලැබේ. මෙම පාඨමාලාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතීකන නිර්දේශයන්ට අනුව (SLQF) අනුකූලවන පරිදි සකස්කර ඇත.**

**ඉලක්කය**

**දැනුම, කුසලතා, ආකල්ප සහ මානසික සැකැස්ම සහිත මනා පරිචයන්ගෙන් යුතු වෘත්තීය උපදේශකවරුන් බිහිකිරීම**

**අරමුණු**

- උපදේශන ක්ෂේත්‍රය සඳහා ගුණාත්මක බවින් හෙබි වෘත්තිකයන් බිහිකිරීම
- උපදේශන වෘත්තිකයන්ගේ උසස් වෘත්තීය කුසලතා පුළුල් කිරීම
- උපදේශන වෘත්තිකයාගේ මැදිහත්වීමේ හැකියාව වර්ධනය කිරීම

**මාධ්‍යය**

**සිංහල/දෙමළ/ඉංග්‍රීසි**

**කාල සීමාව**

**මාස 21කි. මෙම පාඨමාලාවේ මාස 03ක උපදේශන පුහුණුවක් අන්තර්ගත වේ. (සති අන්ත පාඨමාලාවකි)**

**පාඨමාලා ව්‍යුහය**

**සම්පූර්ණ සම්මාන ඒකක (credit) 30කි, දේශන - පැය 405 සහ ක්ෂේත්‍ර පුහුණුව - පැය 135. ඒ අනුව මුලු පැය ගණන පැය 540 කි.**

**උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව විෂය ඒකක 09 කින්, ක්ෂේත්‍ර පුහුණුවකින් සහ අධ්‍යයන චාරිකාවකින් සමන්විත වේ.**

**2018 වර්ෂය තුළ ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වූ ස්ථාන**

1. ජාතික සමාජ සංවර්ධන ආයතනය, කොළඹ ප්‍රධාන මධ්‍යස්ථානය
2. තලාව ප්‍රාදේශීය මධ්‍යස්ථානය
3. අම්පාර ප්‍රාදේශීය මධ්‍යස්ථානය
4. රන්න ප්‍රාදේශීය මධ්‍යස්ථානය
5. වව්නියාව ප්‍රාදේශීය මධ්‍යස්ථානය
6. පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## *3. වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව*



**හැඳින්වීම**

වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව නිර්මාණය කරන ලද්දේ වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණයට අදාල ක්ෂේත්‍ර තුළ තම වෘත්තීය සංවර්ධනය ඇති කර ගැනීමට අපේක්ෂිත පුද්ගලයින්, දැනටමත් මෙම ක්ෂේත්‍රය තුළ රැකියාවෙහි නියලෙන, තම වෘත්තීය මාවත පුළුල් කරගැනීමට අපේක්ෂිත පුද්ගලයින් පදනම් කරගෙනය. වයස්ගත වෙමින් පවතින සමාජය විසින් නිර්මාණය කරනු ලබන නව අවස්ථාවන්ට අනුරූපීයව අර්ථාන්විත වෘත්තීය වෙනස්කම් ඇති කිරීමේ අරමුණින් මෙම පාඨමාලාව පිරිනමනු ලැබේ. අන්තර්විෂයික පාඨමාලාවක් වශයෙන් මෙය සම්පූර්ණ කිරීමේදී, ශිෂ්‍යයින් විසින් දීර්ඝකාලීන හා සෞඛ්‍යය සම්පන්න ජීවිතයක් ගතකිරීම සඳහා ගැටලු විසඳීම සහ කුසලතා ඇතිකිරීමට අවැසි අවශ්‍යතාවන්ගෙන් සන්නද්ධවීම අපේක්ෂිතය. වැඩිහිටි රැකවරණ සේවා ක්ෂේත්‍රය තුළ ශිෂ්‍යයින්, තනි පුද්ගල වෘත්තීය මාවත සංවර්ධනය කර ගැනීමට මෙය උපකාරී වේ.

වෘද්ධ විද්‍යාව හා වැඩිහිටිරැකවරණය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතීතන නිර්දේශයන්ට අනුකූල වන පරිදි (SLQF) සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ තත්ත්ව පරීක්ෂණ ඒකකය (Quality Assurance Unit) පිළිබඳ අවධානය යොමු කරමින් අර්ධකාලීන වැඩසටහනක් වශයෙන්, ශ්‍රී ලංකාව මගින් පිරිනමනු ලබන ජාතික සහ ජාත්‍යන්තරව පිළිගත් සුදුසුකම් සැකසීමේ අරමුණින් වර්ධනය කර ඇත.







**ඉලක්කය**

දැනුම, කුසලතා, ආකල්ප සහ මානසික සැකැස්ම සහිත මනා පරිචයන්ගෙන් යුතු වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය විෂයෙහි කටයුතු කිරීමට බලාපොරොත්තුවන විද්වද් වෘත්තිකයන් පිරිසක් බිහි කිරීම හා මෙම ක්ෂේත්‍රයේ වැඩකිරීමට කැමැත්තක් දක්වන පුද්ගලයින්ගේ සිය වෘත්තිය ධාරිතාව සංවර්ධනය කිරීම.

අරමුණු

- රැකබලා ගන්නන්ගේ ක්ෂේත්‍රය තුළ ගුණාත්මක බවින් පිරි වෘත්තිකයන් බිහිකිරීම
- වැඩිහිටියන් පිළිබඳ ක්ෂේත්‍රයේ නියැලෙන වෘත්තිකයන්ගේ වෘත්තීය කුසලතා පුළුල් කිරීම
- වෘත්තිකයන්ගේ මැදිහත්වීමේ හැකියාව වර්ධනය කිරීම

මාධ්‍යය

සිංහල

කාල සීමාව

මාස **18**

පාඨමාලා ව්‍යුහය

සම්පූර්ණ සම්මාන ඒකක (credit) 30කි, දේශන - පැය 405 සහ ක්ෂේත්‍ර පුහුණුව - පැය 135.ඒ අනුව මුලු පැය ගණන පැය 540 කි.

වෘද්ධ විද්‍යාව සහ වැඩිහිටි රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව විෂය ඒකක 10 සහ ක්ෂේත්‍ර පුහුණුව සමන්විත වේ.

2018 වර්ෂය තුළ මෙම ඩිප්ලෝමා පාඨමාලාව ජාතික සමාජ සංවර්ධන ආයතනය, කොළඹ ප්‍රධාන කාර්යාලය තුළ පමණක් පැවැත්විනි.

ඩිප්ලෝමා පාඨමාලා වලට අමතරව සහතිකපත්‍ර පාඨමාලාද පුහුණු අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබයි. එම සහතික පත්‍ර පාඨමාලා මෙසේ විස්තර කළ හැකිය.

## උපදේශනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව - NAITA

හැඳින්වීම

උපදේශනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව තුළින් අවධානය යොමු කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ මානසික සෞඛ්‍යය සහ මානසික යහ පැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා අතුරු වෘත්තිකයන්ගේ කුසලතා වර්ධනය කිරීම පිළිබඳවය. මෙය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතීතන නිර්දේශයන්ට අනුකූල වන පරිදි (SLQF) සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ තත්ත්ව පරීක්ෂණ ඒකකයේ නිර්දේශයන් (Quality Assurance Unit) මත පදනම් වෙමින් නිර්මාණය කොට ඇත. මෙම පාඨමාලාව 2017 වර්ෂය වන විට පළමු කණ්ඩායමට පැවැත්වූ අතර, දෙවන හා තුන්වන කණ්ඩායම සඳහා වූ සහතික පත්‍ර පාඨමාලාව 2018 වර්ෂය වන විට පවත්වන ලදි.

ඉලක්කය

උපදේශනය සහ සමාජ සුභසාධනය සඳහා අවශ්‍ය දැනුම, කුසලතා, ආකල්ප සහ පුහුණුව සහිත වෘත්තිකයන් සහ අතුරු වෘත්තිකයන් ප්‍රජා මට්ටම තුළ සැපයීම

අරමුණු

- උපදේශනය සඳහා ගුණාත්මක බවින් යුතු අතුරු වෘත්තිකයන් සැපයීම
- සේවාලාභීන්ට අවශ්‍ය වන අතුරු වෘත්තීය කුසලතා පුළුල් කිරීම
- යොමු කිරීමේ සේවාවන් සඳහා නිළධාරීන් සහ සේවා සපයන්නන්ට අවශ්‍ය කුසලතා වර්ධනය කිරීම

මාධ්‍යය

සිංහල

පාඨමාලා කාලය

මාස 06 යි. (දේශන පැය 150 යි. ක්ෂේත්‍ර පුහුණුව පැය 100 යි). මුලු පැය ගණන පැය 250 යි.

පාඨමාලාව විෂය ඒකක 06 සහ ක්ෂේත්‍ර පුහුණුවකින් සමන්විත වේ.

## පුහුණු අංශයේ මානව සම්පත් සංවර්ධනය සඳහා පවත්වන ලද කෙටිකාලීන පුහුණු වැඩසටහන්

### ජාතික මානසික සෞඛ්‍ය දිනය සැමරීම - ජීවිතයට දැක්මක් - අනුරාධපුරය




**ජාතික මානසික සෞඛ්‍ය දින සැමරුම් වැඩසටහන ජීවිතයට දැක්මක් යන අරමුණ පදනම් කර ගනිමින් දිළිඳු බව පිටු දැකීම සඳහා මානසික සෞඛ්‍ය සම්පන්න තරුණ ප්‍රජාවගේ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීමේ සම්මන්ත්‍රණය සහ සමීක්ෂණය අනුරාධපුර යොවුන් නිකේතනයේදී 2018.10.15 දින ගරු අමාත්‍ය පී. හැරිසන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීය. ඒ සඳහා 581ක තරුණ ප්‍රජාවක් සහභාගි විය.**





ජාතික මානසික සෞඛ්‍ය දින සැමරුම් උත්සවයේ ගරු අමාත්‍යතුමාගේ කතාව සහ ආරාධිත දේශනය

කායික, මානසික, සාමාජීය හා ආධ්‍යාත්මික නිරෝගීභාවය ඇති කිරීමේ අරමුණින් මෙහිදී මානසික සෞඛ්‍යය පිළිබඳ විශේෂඥ වෛද්‍ය චමින්ද වීරසිරිවර්ධන මහතාගේ දේශනයක්ද යෞවනයන් අතර පවතින ගැටලු අවබෝධ කරගැනීමේ අරමුණින් සමීක්ෂණයක්ද පවත්වන ලදි. සමාජ සවිබලගැන්වීම්, සුභසාධන සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ ජාතික සමාජ සංවර්ධන ආයතනය මගින් මෙම වැඩසටහන සංවිධානය කර පවත්වන ලදි. මානසික සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රජා තරුණ නායකත්වය ඇති කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණ බවට පත්විය.

## ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන

උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා හදාරන සිසුන්ගේ ක්ෂේත්‍ර පුහුණුව අධීක්ෂණය කරනු ලබන ක්ෂේත්‍ර පරීක්ෂකවරුන්ගේ ධාරිතා සංවර්ධනය කිරීමේ අරමුණින් මෙම වැඩසටහන පවත්වන ලදි. ක්ෂේත්‍ර අධීක්ෂණ කටයුතු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන, උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා හා ඩිප්ලෝමා පාඨමාලාවන්හි ශිෂ්‍ය අධීක්ෂණ කටයුතු වල නිරත වන ජ්‍යෙෂ්ඨ උපදේශන නිලධාරින්හට ශිෂ්‍ය අධීක්ෂණ කටයුතු පිළිබඳව දැනුවත් කිරීම හා ක්ෂේත්‍ර මොඩියුල පිළිබඳ අවබෝධය ලබාදීමේ අරමුණින් 2018.06.28 දින පවත්වන ලදි. අපේක්ෂිත ප්‍රතිලාභීන් සංඛ්‍යාව 30 වූ අතර, සහභාගී වූ සංඛ්‍යාව 29 කි.

වාර්ෂිකව මෙවැනි වැඩසටහනක් පැවැත්වීම තුළ ක්ෂේත්‍ර අධීක්ෂණය පිළිබඳ උපදේශන නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය වන බව පුහුණුකරුවන්ගේ අදහස විය. තවද ශිෂ්‍ය ක්ෂේත්‍ර අධීක්ෂණය තුළ මතුවන ප්‍රායෝගික ගැටලු සහ අභියෝග විවෘත සාකච්ඡාවට ලක් කිරීමට අවශ්‍ය පසුබිම වැඩසටහන හරහා අවකාශ සැලසෙන බව ඔවුන්ගේ අදහස විය. පුහුණු අංශය මගින් ක්ෂේත්‍ර මොඩියුල සම්බන්ධයෙන් කෙරෙන සංශෝධනයන් පිළිබඳව විධිමත් අවබෝධය සහ දැනුම ලබාගැනීමට මෙම වැඩසටහන මහඟු අවස්ථාවක් වන බව ප්‍රකාශ කරන ලදී.

මනෝ විද්‍යාත්මක උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ ක්ෂේත්‍ර කටයුතු විධිමත් කිරීම සම්බන්ධයෙන් පැවැත්වෙන මෙම වැඩමුළුව, සෑම වසරකදීම ඉතාමත් සාර්ථක අයුරින් සිදුකෙරෙන අතර එහිදී ජ්‍යෙෂ්ඨ

උපදේශකවරුන්ගේ දැනුම තවදුරටත් දියුණු කිරීම හා ගැටලු සහගත අවස්ථාවන් නිරාකරණය කරගැනීම සඳහා අවස්ථාව ලබාදේ. ක්ෂේත්‍ර කටයුතු පිළිබඳව නව දැනුම සහ ක්‍රමවේදයන් මොවුනට විධිමත් ආකාරයට මෙම වැඩසටහන තුළ ලබාදෙන අතර එම දැනුම ශිෂ්‍ය ක්ෂේත්‍ර අධීක්ෂණයේදී භාවිතාවට ගැනීමට උපදෙස් ලබාදෙයි. ඒ හරහා අවසාන වශයෙන් නිලධාරීන්හට සාර්ථක ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු වල නිරතවීමට හා තම වෘත්තීය ජීවිතය ආලෝක කරගැනීමට මහඟු පිටුවහලක් වනු ඇත.

## නායකත්ව සංවර්ධනය - කෙටිකාලීන පුහුණු වැඩසටහන

විශේෂ කාර්ය බලකායේ ඉල්ලීම මත ජාතික සමාජ සංවර්ධන ආයතනය මගින් විශේෂ කාර්ය බලකා නිලධාරීන් 150 සඳහා කෙටිකාලීන පුහුණු වැඩසටහන් තුනක් ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සම්පත්ධාරීන් විසින් පවත්වන ලදි. මෙම වැඩසටහන 2018.11.30 දින ආරම්භ කළ අතර, එදින සිට දින 03 බැගින් වැඩසටහන් 03ක් පවත්වන ලදි. එහිදී පහත විෂයය ක්ෂෙත්‍ර පදනම් කරගනිමින් පුහුණු වැඩසටහන් පවත්වන ලදි.

- මූලික උපදේශන කුසලතා පුහුණුව
- නායකත්ව පුහුණුව
- ගැටුම් කළමණාකරණය
- ක්ලමථ කළමණාකරණය

මෙම වැඩසටහන් මාලාව පැවැත්වීම සඳහා මූල්‍යමය දායකත්වය විශේෂ කාර්ය බලකාය, කළුතර කොට්ඨාශය මගින් දරන ලදි. මානව සම්පත් සංවර්ධනය කිරීමේ අරමුණින් මෙම වැඩසටහන්මාලාව පවත්වන ලදී.

### පුහුණු අංශය විසින් 2018 වර්ෂයේදී පවත්වන ලද පුහුණු සහ අධ්‍යයන වැඩසටහන් පිළිබඳ විස්තර වාර්තාව

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ක්‍රියාකාරකම | වියදම රු. | අපේක්ෂිත ප්‍රතිඵලය | අපේක්ෂිත නිමැවුම | සම්පූර්ණ කරන ලද දිනය |
|---|---|---|---|---|---|---|
| 01 | මානසික සෞඛ්‍ය දිනය - අනුරාධපුරය | ජීවිතයට දැක්මක් | 1533515.48 | 581 තරුණ ප්‍රජාව | මානසික සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රජා තරුණ නායකත්වය | 2018.10.15 |
| Daniel Sanders | 20001-05-41842 | 2,573 | 1,587 |
| Daniel Sanders | 143-6001-0000-2693-2 | 2,518 | 1,913 |
| Swarna Jayalath | 20001-16-06956 | 1,013 | 782 |
| People's bank | 143-6001-0000-1780-8 | 4,563 | 4,831 |
| People's bank | 143-6001-0000-1779-1 | 4,563 | 4,831 |
| People's bank | 143-6001-0000-1781-7 | 4,563 | 4,831 |
| People's bank | 143-6001-0000-2419-5 | 15,866 | 17,452 |
| People's bank | 143-6001-0000-2421-1 | 15,866 | 17,452 |
| People's bank | 143-6001-0000-2152-6 | 15,866 | 15,271 |
| People's bank | 143-6001-0000-2153-5 | 15,866 | 15,271 |
| People's bank | 143-6001-0000-2026-0 | 8,565 | 9,662 |
| People's bank | 143-6001-0000-2024-2 | 8,565 | 9,662 |
| People's bank | 143-6001-0000-2027-9 | 8,565 | 9,662 |
| People's bank | 143-6001-0000-2025-1 | 8,565 | 9,662 |
| People's bank | 1436001000037289 | 25,555 | 26,178 |
| People's bank | 1436001000037270 | 25,555 | 26,178 |
| People's bank | 1436001000037261 | 25,555 | 26,178 |
| People's bank | 1436001000037252 | 25,555 | 26,178 |
| People's bank | 1436001000037243 | 25,555 | 26,178 |
| People's bank | 1436001000037234 | 25,555 | 26,178 |
| People's bank | 1436001000037225 | 25,555 | 26,178 |
| People's bank | 1436001000037216 | 25,555 | 26,178 |
| People's bank | 1436001000037207 | 25,555 | 26,178 |
| People's bank | 1436001000037190 | 25,555 | 26,178 |
| Rasanayagam peoples bank MSW | 143-6001-0000-2701-2 | 2,244 | 1,700 |
| R. Jayasingha Imandi Ronali | 143-6001-0000-2153-3 | 3,486 | 688 |
| TG & MG Peoples bank MSW | 143-6001-0000-2352-4 | 2,592 | 2,500 |
| | | **394,787** | **400,698** |

**NATIONAL INSTITUTE OF SOCIAL DEVELOPMENT**
**SCHEDULES TO THE FINANCIAL STATEMENTS**
**FOR THE YEAR ENDED 31st DECEMBER**
*(All amounts are in Sri Lankan Rupees)*

**SCHEDULE - 05 FIXED DEPOSITS**

| | | 2018 | 2017 |
|---|---|---|---|
| M.M.M.Nazeer & Family Fund | 143-6001-0000-3306-9 | 69,906 | 62,979 |
| Daniel Sanders | 20001-17-85290 | 30,000 | 30,000 |
| Daniel Sanders | 20001-17-31696 | 30,000 | 30,000 |
| Daniel Sanders | 20001-16-06930 | 65,000 | 65,000 |
| Daniel Sanders | 20001-05-39449 | 90,000 | 90,000 |
| Daniel Sanders | 20001-05-41842 | 29,514 | 29,514 |
| Daniel Sanders | 143-6001-0000-2693-2 | 30,000 | 30,000 |
| Swarna Jayalath | 20001-16-06956 | 15,000 | 15,000 |
| People's bank | 143-6001-0000-1780-8 | 250,000 | 250,000 |
| People's bank | 143-6001-0000-1779-1 | 250,000 | 250,000 |
| People's bank | 143-6001-0000-1781-7 | 250,000 | 250,000 |
| People's bank | 143-6001-0000-2419-5 | 500,000 | 500,000 |
| People's bank | 143-6001-0000-2421-1 | 500,000 | 500,000 |
| People's bank | 143-6001-0000-2152-6 | 500,000 | 500,000 |
| People's bank | 143-6001-0000-2153-5 | 500,000 | 500,000 |
| People's bank | 143-6001-0000-2026-0 | 500,000 | 500,000 |
| People's bank | 143-6001-0000-2024-2 | 500,000 | 500,000 |
| People's bank | 143-6001-0000-2027-9 | 500,000 | 500,000 |
| People's bank | 143-6001-0000-2025-1 | 500,000 | 500,000 |
| Rasanayagam peoples bank MSW | 143-6001-0000-2701-2 | 30,000 | 30,000 |
| R. Jayasingha Imandi Ronali | 143-6001-0000-2153-3 | 25,000 | 25,000 |
| TG & MG Peoples bank MSW | 143-6001-0000-2352-4 | 50,000 | 50,000 |
| People's bank | 1436001000037289 | 1,000,000 | 1,000,000 |
| People's bank | 1436001000037270 | 1,000,000 | 1,000,000 |
| People's bank | 1436001000037261 | 1,000,000 | 1,000,000 |
| People's bank | 1436001000037252 | 1,000,000 | 1,000,000 |
| People's bank | 1436001000037243 | 1,000,000 | 1,000,000 |
| People's bank | 1436001000037234 | 1,000,000 | 1,000,000 |
| People's bank | 1436001000037225 | 1,000,000 | 1,000,000 |
| People's bank | 1436001000037216 | 1,000,000 | 1,000,000 |
| People's bank | 1436001000037207 | 1,000,000 | 1,000,000 |
| People's bank | 1436001000037190 | 1,000,000 | 1,000,000 |
| | | **15,214,420** | **15,207,493** |

**NATIONAL INSTITUTE OF SOCIAL DEVELOPMENT**
**SCHEDULES TO THE FINANCIAL STATEMENTS**
**FOR THE YEAR ENDED 31st DECEMBER**
*(All amounts are in Sri Lankan Rupees)*

**SCHEDULE - 06 EMPLOYEE BENEFITS**

| | 2018 | 2017 |
|---|---|---|
| **Non Current** | | |
| Mr. K. M. Y. Karunarathna | 633,107 | 518,588 |
| Mrs. M.T.R.S. Attanayaka | 635,096 | 452,677 |
| Mrs. V. Gowry Vasudeven | 407,233 | 314,822 |
| Mrs. E.A.M.S.P. Wijesekara | 179,721 | 134,088 |
| Mr. Varatharajah Jeyaruban | 188,510 | 127,871 |
| Rev.O.Somananda Thero | - | 139,788 |
| Mr. U. L. M. Ashker | 93,620 | 74,533 |
| Mr. S. Hariharathamotharan | 127,425 | 86,536 |
| Mrs. M.K.G.I.U. Gunarathna | 38,119 | 26,981 |
| Mrs. C.M. Munasingharachchi | 36,813 | 26,081 |
| Miss. W.B.H. Jayawardena | - | 27,941 |
| Mrs.A.P.L.B.Nirukshi | 5,189 | - |
| Miss. V. Balamathy | 42,601 | 30,064 |
| Mrs. S. Sivakumaran | 44,312 | 31,238 |
| Mrs. L R Abewickrama | 28,238 | 20,005 |
| Miss H.M.D. Subodini Herath | 29,194 | 20,672 |
| Mrs. H.M.S. Niroshani | 36,474 | 25,741 |
| Mrs Y.H.S. Silva | 23,083 | 13,964 |
| Mrs. L.C.I. Silva | 31,321 | 20,753 |
| Mrs. L.K. Pushpakanthi | 243,692 | 137,638 |
| Mr. M.S.M. Asmiyas | 356,236 | 222,004 |
| Mrs. K. P. D. Niroshika | 141,671 | 110,400 |
| Mrs. K.S. Wadisingha | 49,092 | 35,425 |
| Mr. P.C. Hettiarachchi | 42,573 | 31,238 |
| Mrs. A.M.K.L. Adikari | 38,012 | 27,941 |
| Mr. A.H. Ubaidullah | 48,202 | 35,298 |
| Mr. B.K.S. Karunarathna | 42,573 | 31,238 |
| Mr. J.H.I. Prasad | 40,948 | 30,064 |
| Mr. T. Tharshan | 36,685 | 26,981 |
| Mrs. E. N. K. Rasangika | - | - |
| Mr. J.K.P.U. Keerthi | 64,709 | 35,653 |
| Mr. H.M.S.B. Herath | - | 30,354 |
| Mrs. H.K.S.K. Sirikumara | 36,257 | 26,981 |
| Dr. P.P.G.C. Siriwardena | - | 30,064 |
| Mrs. B.A. N.P. Wijebandara | 135,401 | 94,707 |
| Mrs. A.M. Manamudali | 28,934 | 15,375 |
| Miss S.H.N. Madushani Silva | 15,767 | 11,834 |
| Mrs A.E.Jayawarne | 16,303 | 12,229 |
| Mrs. K.C.K.Thabrew | 16,303 | 12,229 |
| Mr.A.H.Indika Sanjeeva | 19,584 | 14,645 |
| Mr.D.M. Wasanatha Kumara | 131,616 | 108,856 |
| Miss. K.N. Samanthi | - | 33,107 |
| Mr. S A S N Premarathna | 2,807 | - |
| Mr. K.S.W.Wickramasinghe | 34,021 | 22,556 |
| Mrs.C.H.D.Hettiarachchi | 193,360 | 161,161 |

**NATIONAL INSTITUTE OF SOCIAL DEVELOPMENT**
**SCHEDULES TO THE FINANCIAL STATEMENTS**
**FOR THE YEAR ENDED 31st DECEMBER**
*(All amounts are in Sri Lankan Rupees)*

**SCHEDULE - 06 EMPLOYEE BENEFITS *(Contd ....)***

| | 2018 | 2017 |
|---|---|---|
| Mrs. Danushka Ussetti | 66,878 | 52,493 |
| Mrs. M.K. Palihakkara | - | 275,454 |
| Mrs. Nilupa Manathunga | 158,536 | 150,259 |
| Mrs. R.M. Renuka Damayathi | 136,574 | 119,966 |
| Mr. D.K.I. Wijerathna | 47,961 | 38,677 |
| Mr. H.C.B.Sumanapala | 37,867 | 30,601 |
| Mr. Y.M. Nimsath | 56,174 | 33,536 |
| Mr. P.L.Munasinghe | 38,791 | 31,613 |
| Miss. H.K.F. Rameeza | 35,011 | 26,902 |
| Mr. D.C.S. Gunawardhana | - | 10,265 |
| Mrs. D. M. Pushpa Dissanayaka | 125,309 | 111,857 |
| Mrs. P. Deepika Damayanthi | 80,264 | 71,127 |
| Mrs. M. I. S. Neelakanthi | 209,321 | 182,030 |
| Mrs. G.L.Chamila Nilmini | - | 120,602 |
| Mrs. Seetha Rathnayake | 183,989 | 160,274 |
| Mrs. K. M. Samalatha | - | 309,857 |
| Mr. H. M. Upali Herath | 138,041 | 116,020 |
| Mrs. H. L. Nayana Liyanage | 105,762 | 92,433 |
| Mrs. Champika Gunasekara | 90,553 | 72,904 |
| Mrs. Yasanthika Madawalage | 48,853 | 41,718 |
| Mrs Nadika Priyadarshani.Silva | 53,139 | 44,904 |
| Mrs. M. S. A. Fathima Fareeha | 50,663 | 42,852 |
| Mr. W. Wimal Ranjith Silva | 53,054 | 46,279 |
| Mrs. R.Darshani | 25,420 | 20,158 |
| Mr. S. Eranga Mendis | 40,018 | 34,179 |
| Mrs. G.M. Dilani Kaushalya | 16,107 | 12,697 |
| Mrs. A.D. Jayasinghe | 22,642 | 17,724 |
| Mrs. R.S.K. Pinto | 18,526 | 14,562 |
| Mrs.W.A.S.V. Lakmali | 18,526 | 14,562 |
| Mr. W.I.N.Madusanka Silva | 17,860 | 14,049 |
| Miss. N.H. Hewapathirana | 18,526 | 14,562 |
| Miss. H. Seelawathi | 109,195 | 120,303 |
| Mrs. T.M.Kmalawathi | 26,329 | 24,554 |
| Mr.U.N.Samitha Silva | 13,368 | 10,115 |
| Miss.U.Thasila Banu | 15,965 | 12,036 |
| Mr.H K D Wijeyantha | 19,669 | 16,146 |
| Mrs. I.D.R. Maduwanthi | 14,306 | 10,810 |
| Miss. D.M.R. Charitha | 11,012 | 7,805 |
| Miss R.P.D. Arunodhi | 9,992 | 7,134 |
| Mr.T.D. Ariyadasa | 10,311 | 7,319 |
| Mr.S.M.T.B.Samarakoon | 17,989 | 12,623 |
| Mr. P. R. Dayananda | 288,175 | 250,428 |
| Mr. Pandula Widdanapathirana | 109,548 | 94,820 |
| Mr. A. A. Upali Rupasinghe | 100,253 | 85,715 |
| Mr. Janaka Kumara | 48,281 | 41,124 |
| Mr. J. A. Samantha | 69,919 | 59,097 |
| Mr. Ruwan Chandana | 43,481 | 35,483 |
| Mr.A.D.I. Pushpakumara | 26,246 | 20,487 |
| Mr.W.M.A. Bandara | 43,657 | 33,711 |
| Mr.Y.G.S.K. Jayalath | 13,141 | 9,948 |
| Mr. Jazooli Jeffry | 148,522 | 131,870 |
| Mr. D. M. D. Dissanayake | 186,795 | 164,303 |
| Mr. Amila Sampath | 88,320 | 84,188 |
| Mr. S. N. G. Premarathna | 92,809 | 77,966 |
| Mr. Dilanka Gunawardana | 25,730 | 20,769 |
| Mr. S.M. Asanka Jayaranga | 17,532 | 14,249 |
| Mr. Amila Prasad | - | 19,123 |
| Mr.Y.M.B. Gayan | 21,734 | 14,649 |

**NATIONAL INSTITUTE OF SOCIAL DEVELOPMENT**
**SCHEDULES TO THE FINANCIAL STATEMENTS**
**FOR THE YEAR ENDED 31st DECEMBER**
*(All amounts are in Sri Lankan Rupees)*

**SCHEDULE - 06 EMPLOYEE BENEFITS *(Contd ....)***

| | 2018 | 2017 |
|---|---|---|
| Mr.D.D.M. Jayasinghe | 11,656 | 8,820 |
| Mr.A.S.K.Alankara | 16,105 | 12,146 |
| Mrs. A.V. Nishali Silva | 16,105 | 12,146 |
| Miss.U.R.R.L. Madushani | 12,432 | 9,429 |
| Mr.W.G.Inika Prasad | 15,285 | 10,766 |
| Mrs.K.P.C. Nimalika | 15,285 | 14,354 |
| Mr. D.M.Samarasena | 63,273 | 46,625 |
| Mrs.B.G.M.Samarasinghe | 10,563 | 3,407 |
| Mrs.K.W.T.K.Karandawala | 10,563 | 3,682 |
| Mr. N.W.T.Chinthaka | 6,599 | 2,621 |
| Miss. K.Kitnasamy | - | 2,847 |
| Miss. M.D.J.S.Gamage | 4,955 | 2,050 |
| Miss. M.H.L.C.Dayarathne | 5,281 | 2,192 |
| Mr. V.Kajendran | 7,420 | 3,128 |
| Mr. M.L.M.Sathsara | 7,420 | 3,128 |
| Mrs. H.P.S.Jayathilake | 9,369 | 3,992 |
| Mr.G.Karunakaran | 9,982 | 4,070 |
| Mr.J.David | 6,117 | 2,607 |
| | **8,009,859** | **7,250,220** |
| **Current** | | |
| Dr. Riddley Jayasinghe | - | 828,970 |
| Mrs. K. M. Samalatha | 351,638 | - |
| Mrs. M.K. Palihakkara | 337,056 | - |
| | **688,695** | **828,970** |

**SCHEDULE - 07 PAID COURSE INCOME**

| | 2018 | 2017 |
|---|---|---|
| Research on Mahajana Sambandatha | - | 74,997 |
| Dip in Social Work- Ranna 16/17 | 725,000 | 441,248 |
| Dip in co. 2017/19 Ampara-S | 867,000 | - |
| Dip in co. 2018/20 Thalawa | 1,071,000 | - |
| Dip. in co. 2018/19 Samurdhi | 3,255,000 | - |
| Dip in co. 2017/19 Ampara - T | 2,422,500 | - |
| Dip in cou. 2018/20 Kili (T) | 1,027,000 | - |
| Dip in Coun Ampara 15/17(Tamil) | - | 200 |
| Thalawa Coun 2015/2017 (Sin) | 1,224,000 | - |
| Dip in coun/Batti (2015/2017) | - | - |
| Elder Care 2015/2017 (Anu) | - | 144,850 |
| Training for Ministry of judicial | - | 31,680 |
| Dip in Coun Vavuniya15/17(T) | - | - |
| Certificate co.in coun2017/18-I | 352,000 | 528,000 |
| Ampara Coun,15/17 (Sin) | - | - |
| Child Protection Batticaloa 15/16 | - | - |
| Counselling Tamil Col 2015/2017 | - | 1,000 |
| Counselling 2015/2017(Sinhala) | - | 180,000 |
| MSW 2015/2017 | 1,000 | 132,000 |
| MSW 2018/20 | 2,043,000 | - |
| DSW 2018/19 | 20,700 | - |
| Women Empowerment Programme | 156,808 | - |
| 3K Project | 194,700 | - |
| MSW 2016/2018 | 1,876,250 | 1,876,250 |
| Dip in coun. Kili-2017/19 Tamil | - | 816,000 |
| Dip in Coun Thalawa 2016/18 | 1,224,000 | 816,000 |
| Dip.in.Counseling 2013/15 Tamil | - | 1,000 |
| Unicef Donations for Chi Protection | - | 300,000 |

**NATIONAL INSTITUTE OF SOCIAL DEVELOPMENT**
**SCHEDULES TO THE FINANCIAL STATEMENTS**
**FOR THE YEAR ENDED 31st DECEMBER**
*(All amounts are in Sri Lankan Rupees)*

**SCHEDULE - 07 PAID COURSE INCOME *(Contd ....)***

| | 2018 | 2017 |
|---|---|---|
| DSW 2016/18 | - | 300 |
| Course in child focused 17/18 | 247,500 | 82,500 |
| Dip in coun 17/19 Thalawa-(sin) | - | 816,000 |
| Dip in co. 2018/20 Kandy (T) | 1,377,000 | - |
| Dip in co. 2018/20 Colo (S) | 1,020,000 | - |
| Dip in co. 2018/20 Colo (T) | 1,020,000 | - |
| Higher Dip in Coun14/16(T&Sin) | - | 3,000 |
| Dip in co. Trinco 2018/20 Tamil | 1,122,000 | - |
| Dip in coun.16/18 Colo (T) | 1,020,000 | 1,530,000 |
| Dip in counseling 16/18Colo (E) | 892,500 | 892,500 |
| Thalawa Centre | - | 109,950 |
| Dip in Coun 16/18 Sinhala-Colo | 1,275,000 | 1,275,000 |
| CKDU Research | - | 1,927,500 |
| Dip in co. 2018/20 Colo - E | 688,500 | - |
| Programme Income | - | 781,487 |
| Sign Language 16/17 | - | 1,837,000 |
| Dip Coun Batticaloa(T) 2016/18 | 1,239,300 | 2,272,050 |
| Dip in Counseling16/18-Puttalam | 204,000 | 1,326,000 |
| Dip in Coun Killinochchi16/18-T | 1,224,000 | 1,020,000 |
| Dip in Community Correction16/18 | 1,701,000 | 1,944,000 |
| Elder Care 2018 (Ranna) | 1,071,000 | - |
| Dip Child Pro 16/18(Anuradhapura) | 102,000 | 1,530,000 |
| Dip Child Pro16/18(Kilinochchi)T | 127,500 | 1,912,500 |
| Dip Child Pro 16/18(Monaragala) | 107,100 | 1,606,500 |
| Dip Child Pro 16/18(Ampara) | 111,000 | 1,665,000 |
| Dip Child Pro 16/18(Batticaloa) | 102,000 | 1,530,000 |
| Child Focused Com D(Killi 2016) | - | 52,500 |
| Dip in social work - 2018/2019 | 1,132,752 | - |
| Social Development Officers Programme | 26,260 | - |
| | **32,270,370** | **29,457,012** |

**NATIONAL INSTITUTE OF SOCIAL DEVELOPMENT**
**SCHEDULES TO THE FINANCIAL STATEMENTS**
**FOR THE YEAR ENDED 31st DECEMBER**
*(All amounts are in Sri Lankan Rupees)*

**SCHEDULE - 08 INTEREST FROM FIXED DEPOSITS**

| | | 2018 | 2017 |
|---|---|---|---|
| M.M.M.Nazeer & Family Fund | 143-6001-0000-3306-9 | 7,129 | 5,725 |
| Daniel Sanders Fund | | 28,143 | 26,592 |
| Swarna Jayalath Fund | 20001-16-06956 | 1,519 | 1,207 |
| People's bank F/D's | | 1,513,624 | 1,667,923 |
| Rasanayagam MSW Fund | 143-6001-0000-2701-2 | 3,248 | 2,550 |
| Imandi Ronali Fund | 143-6001-0000-2153-3 | 2,733 | 2,750 |
| TG & MG MSW Fund | 143-6001-0000-2352-4 | 5,440 | 5,000 |
| | | **1,561,836** | **1,711,747** |

**SCHEDULE - 09 DIFFERED INCOME**

| | 2018 | 2017 |
|---|---|---|
| Dip in Sign Lanuge & Inter16/17 | - | - |
| MSW 2016/2018 | - | 1,876,250 |
| Dip Coun Batticaloa(T) 2016/18 | - | 1,239,300 |
| Dip in Counseling16/18-Puttalam | - | 204,000 |
| Dip in coun Killinochchi16/18-T | - | - |
| Dip inCommunity Correction16/18 | - | 1,701,000 |
| Dip Child Pro 16/18(Anuradhapu) | - | 102,000 |
| Dip Child Pro16/18(Kilinochch)T | - | 127,500 |
| Dip Child Pro 16/18(Monaragala) | - | 107,100 |
| Dip Child Pro 16/18(Ampara) | - | 111,000 |
| Dip Child Pro 16/18(Batticaloa) | - | 102,000 |
| Child Focused Com D(Killi 2016) | - | - |
| Certificate co.in coun2017/18-I | - | 352,000 |
| Certi.co.in child focused 17/18 | - | 247,500 |
| Dip in coun. Kili-2016/18 Tamil | - | 1,224,000 |
| Dip in coun 16/18 Thalawa-(sin) | - | 1,224,000 |
| Dip in Coun 16/18 Sinhala-Colo | - | 1,275,000 |
| Dip in counseling 16/18Colo (E) | - | 892,500 |
| Dip in coun.16/18 Colo (T) | - | 1,020,000 |
| Dip in Coun Thalawa 2016/18 | - | 1,224,000 |
| Receivable from Dr.Lakshika Liyanage(Nopay Bond) | - | 1,456,688 |
| Dip in co. 2018/20 Colo - E | 688,500 | - |
| Dip in co. Trinco 2018/20 Tamil | 1,122,000 | - |
| Dip in co. 2018/20 Colo (T) | 1,020,000 | - |
| Dip in co. 2018/20 Colo (S) | 1,020,000 | - |
| Dip in co. 2018/20 Kandy (T) | 1,377,000 | - |
| Dip in cou. 2018/20 Kili (T) | 1,027,000 | - |
| Dip in co. 2017/19 Ampara - T | 2,422,500 | - |
| Dip. in co. 2018/19 Samurdhi | 3,255,000 | - |
| Dip in co. 2018/20 Thalawa | 714,000 | - |
| Dip in co. 2017/19 Ampara-S | 867,000 | - |
| MSW 2018/2020 | 2,043,000 | - |
| | **15,556,000** | **14,485,838** |

**NATIONAL INSTITUTE OF SOCIAL DEVELOPMENT**
**SCHEDULES TO THE FINANCIAL STATEMENTS**
**FOR THE YEAR ENDED 31st DECEMBER**
*(All amounts are in Sri Lankan Rupees)*

**SCHEDULE - 10 COURSE FEES RECEIVABLE**

| | 2018 | 2017 |
|---|---|---|
| Dip:in Child Protection 16/18 | - | - |
| Dip in Coun Thalawa 2016/18 | 480,500 | 1,239,500 |
| Dip in coun.16/18 Colo (T) | 223,000 | 709,750 |
| Dip in counseling 16/18Colo (E) | 253,450 | 353,450 |
| Dip in Coun 16/18 Sinhala-Colo | - | 534,250 |
| Dip in coun 16/18 Thalawa-(sin) | 893,925 | 1,699,925 |
| Dip in coun. Kili-2016/18 Tamil | 248,000 | 1,245,000 |
| Certi.co.in child focused 17/18 | 63,000 | 85,000 |
| Dip In Child Prot - Batt 16/18 | 30,000 | 30,000 |
| Dip In child Prot - Amp16/18 | 64,825 | 105,825 |
| Dip In Child Prot - Anu 16/18 | 1,250 | 18,000 |
| Dip In Coun - killino - 16/18 | 190,000 | 215,000 |
| Dip In Coun - Puttalam - 16/18 | 12,000 | 12,000 |
| Dip In Coun - Batti - 16/18 | 29,500 | 246,500 |
| MSW 2016/2018 | 991,600 | 1,541,000 |
| Diploma in Sign Language | 336,000 | 348,500 |
| MSW 2018/2020 | 75,150 | - |
| Dip in co. 2017/19 Ampara-S | 1,337,050 | - |
| Dip in co. 2018/20 Thalawa | 954,000 | - |
| Dip. in co. 2018/19 Samurdhi | 3,448,500 | - |
| Dip in co. 2017/19 Ampara - T | 2,383,000 | - |
| Dip in cou. 2018/20 Kili (T) | 313,000 | - |
| Dip in co. 2018/20 Kandy (T) | 817,000 | - |
| Dip in co. 2018/20 Colo (S) | 923,000 | - |
| Dip in co. 2018/20 Colo (T) | 379,000 | - |
| Dip in co. Trinco 2018/20 Tamil | 1,649,000 | - |
| Dip in co. 2018/20 Colo - E | 765,500 | - |
| | **16,861,250** | **8,383,700** |

**SCHEDULE - 11 SPECIAL ADVANCE**

| | 2018 | 2017 |
|---|---|---|
| Amila Prasad | 1,600 | - |
| K K Wimal Ranjith Silva | 2,000 | - |
| Y.Madawalage | 2,000 | - |
| H.M.Upali Herath | 2,000 | - |
| | **7,600** | **-** |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | එල්/ඩබ්/සී/එන්අයිඑස්ඩී/<br>1/18/10 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2019 මැයි 31 දින. |

සභාපති

ජාතික සමාජ සංවර්ධන ආයතනය

**ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත්: 1. ලේකම්, ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය

2. ලේකම්, මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්ර්ඩබ්/සී/එන්අයිඑස්ඩී/1/18/10    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2019 මැයි 31 දින.

සභාපති

ජාතික සමාජ සංවර්ධන ආයතනය

**ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කල මතය**

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

(අ) ගිණුම්කරණ දෝෂ

---

(i) සමාලෝචිත වර්ෂයේ ප්‍රත්‍යාගණනය කරන ලද වාහන 09 ක ක්ෂය වටිනාකම රු.542,879 ක් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ලාභය වැඩිවීමත්, ඉකුත් වර්ෂයේ ගොඩනැගිලි ක්ෂය එම වර්ෂයට අදාලව රු.593,720 ක් ගිණුම්ගත නොවී සමාලෝචිත වර්ෂයේ ක්ෂය ලෙස ගිණුම්ගත වීම හේතුවෙන් වර්ෂයේ ලාභය අඩුවෙන් දැක්වුණු අතර ප්‍රත්‍යාගණනය කරන ලද වාහන 09 ක සමුච්චිත ක්ෂය වටිනාකම රු.14,494,346 ක් අඩුවෙන් දැක්වීම හේතුවෙන් ප්‍රත්‍යාගණන ලාභයද අඩුවෙන් දැක්වුණි.

(ii) ආයතනය විසින් සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කර වැඩ අවසන් නොවූ තොරතුරු පද්ධතිය වෙනුවෙන් විවිධ අවස්ථාවල වියදම් කළ රු.2,296,000 ක් කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කළ යුතු වුවද පුනරුත්තාපන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් වර්ෂයේ පුනරාවර්තන වැය වැඩියෙන් දැක්වුණු අතර වර්ෂයේ අතිරික්කය ද එම අගයෙන් අඩුවෙන් දැක්වුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට

2

අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලින මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

3

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ආ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව,මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වා ගෙන ගොස් තිබුණි..
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපවේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

4

අනුගමනය කරනලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීමට තුළ පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුවම අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූලනොවන ලෙස ක්‍රියාකර ඇතිබව.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂන හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස, ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව .

(අ) අරමුදල් ඌන උපයෝජනය

--------------------------------

(i) සමාලෝචිත වර්ෂය තුළ කිලිනොච්චිය, තලාව, රන්න සහ අම්පාර යන ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන සහ කොළඹ පුහුණු අංශයේ පුහුණු වැඩසටහන් පැවැත්වීමට එක් මධ්‍යස්ථානයකට රු.100,000 බැගින් රු.500,000 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබාදී තිබුණද එම වැඩසටහන් සඳහා රු.393,130 ක් වියදම් කර තිබුණි. ඒ අනුව සැලසුම් කළ වැඩසටහන් සම්පූර්ණයෙන් නොපැවත්වීම හේතුවෙන් අරමුදල් උපයෝජනය කර ගැනීමට නොහැකිවී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය විසින් වැඩසටහන් 14 ක් සැළසුම් කර තිබුණු අතර ඉන් වැඩසටහන් 09 කට රු.4,700,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ වුවද එම වැඩසටහන් 09 සඳහා රු. 790,346 ක් වියදම් කර තිබුණි. ඒ අනුව ඒ අනුව සැලසුම් කළ වැඩසටහන් සම්පූර්ණයෙන් නොපැවත්වීම හේතුවෙන් අරමුදල් උපයෝජනය කර ගැනීමට නොහැකිවී තිබුණි.

5

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ආ) කොන්ත්‍රාත් පරිපාලන අඩුපාඩු

කැළණිය කාන්තා නේවාසිකාගාර ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් ආයතනය විසින් කොන්ත්‍රාත්කරු සමග කොන්ත්‍රාත්තුවට අදාල කොන්දේසි ඇතුළත් ලිඛිත ගිවිසුමකට අත්සන් කර නොතිබුණි. එසේම රු.573,497 ක් වූ වැඩ ඇස්තමේන්තුව තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර නිර්දේශ ලබාගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ ජූනි 08 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණු අතර 2018 ජූනි 06 දින වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වශයෙන් සියයට 20 ක් ගෙවීම වෙනුවට සියයට 40 ක් වූ රු.206,459 ක් අත්තිකාරම් ගෙවා තිබුණි. ඒ සඳහා කොන්ත්‍රාත්කරුගෙන් අත්තිකාරම් බැදුම්කරයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කිරීමට මාස තුනකට වඩා වැඩි කාලයක් ගතවී තිබුණි.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) 2003 ජූනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 දැක්වෙන කරුණු ඇතුළත්ව සංයුක්ත සැළැස්මක් සකස් කළ යුතු වුවද, ආයතනය 2018 වර්ෂය සඳහා සංයුක්ත සැළැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) කාර්ය මණ්ඩල පරිපාලනය

(i) ආයතනයේ මහාචාර්ය තනතුර 2014 වර්ෂයේ සිට විගණන දිනයවූ 2019 මැයි 24 දින දක්වා වසර 05 කට ආසන්න කාලයක් පුරප්පාඩු වී පැවතියද 2019 මැයි 30 වන දිනටත් මෙම බඳවා ගැනීම ප්‍රමාදව පැවතිණි.

(ii) ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර 2018 ජනවාරි 05 දින සිට පුරප්පාඩුව පැවතුණු අතර විශ්‍රාම ලබාගත් අධ්‍යක්ෂ ජනරාල්වරයාම අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මාස 06 ක් වැඩබැලීමට පත්කර ගෙන තිබුණි. එසේම සුදුසු අයෙකු පත් කරන තෙක් 2018 ජූලි 07 දින සිට මේ දක්වා රාජකාරි ආවරණය කිරීමට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් පත්කර තිබුණි. ආයතන සංග්‍රහයේ ii වැනි පරිච්ඡේදයේ 13.3 වගන්තිය අනුව වැඩ බැලීමේ පත්කිරීමක් සිදු කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් සහ අදාළ තනතුරට පූර්ණ කාලීන නිලධාරියෙකුගේ

6

සේවය අවශ්‍ය නම් නිත්‍ය පත්කිරීම නොපමාව කළ යුතුය. කෙසේ වුවද, මෙම තනතුර සඳහා පත්කිරීම වර්ෂ 01 ට වැඩි කාලයක් ප්‍රමාද තත්ත්වයක පැවතිණි.

(iii) ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු 02 ක් ද, ජ්‍යෙෂ්ඨ පුහුණු නිලධාරී තනතුරු 02 ක් ද, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී 01ක් ද, පර්යේෂණ නිලධාරී 03 ක් ද, කථිකාචාර්ය තනතුරු (1 සහ 11) 05 ක්ද, ඉංග්‍රීසි උපදේශක තනතුරු 02 ක්ද වශයෙන් අධ්‍යයන කටයුතු වලට අදාලව තනතුරු 15 ක පුරප්පාඩු 2019 මැයි 30 දින වනවිටත් පැවතිණි. ඒ හේතුවෙන් ආයතනයේ මූලික අරමුණුවූ පුහුණු පාඨමාලා පවත්වා ගැනීමට මෙය බාධාවක්වී තිබුණි.

**(ඇ) ලැබිය යුතු මුදල්**

--------------------

(i) ආයතනය විසින් 2016 සහ 2017 වර්ෂ 02 තුළ ආරම්භ කර සමාලෝචිත වර්ෂය තුළ අවසන් වන පාඨමාලා 14 ක අධ්‍යයන කටයුතුවල යෙදීසිටින සිසුන්ගෙන් රු.3,817,050 ක් ලැබිය යුතුව තිබුණි.

(ii) ආයතනට ඉකුත් වර්ෂයේ යුනිසෙෆ් ආයතනයෙන් ලැබිය යුතුව තිබුණු රු.150,000 ක මුදලක් වර්ෂ 02 ක් ගතවී ඇතත් එය අය කර ගැනීමට නොහැකිවී තිබුණි.

(ඈ) අයවැයගත ආදායම් හා වියදම් සහ සත්‍ය ආදායම් වියදම් අතර සියයට 27 සිට සියයට 86 දක්වා පරාසයක් තුල විචලනයන් නිරීක්ෂණය වු බැවින් සඵල කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙස අයවැය ලේඛනය යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

7

**ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2018 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා අධ්‍යක්ෂ ජනරාල්ගේ නිරීක්ෂණ.**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පිළිතුරු.**

**අ. ගිණුම්කරණ දෝෂ.**

I. ප්‍රත්‍යාගණන අතිරික්තය ගණනය කිරීමේ දී සමුච්චිත ක්ෂය එම ගිණුම් වලින් ඉවත් කිරීමේ සටහන මගහැරී ඇත. එබැවින් විගණන විමසුමෙන් පෙන්වා දී ඇති දෝෂය අප පිළිගන්නාඅතර නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව කාරුණිකව දන්වමි.
වසරේ ගිණුම් විගණනය කිරීමේ දී එම ගිණුම් වල දක්වා ඇති ක්ෂය පිළිබඳ තාක්ෂණික දෝෂයක් ඇති බව අප වෙත දන්වන ලදි. එම කරුණ ඉතා නිවැරදි වන අතර අප විසින් පිළිගන්නා සේම 2018 වසරේ ගිණුම් ඉදිරිපත් කිරීමේ දී නිවැරදි කිරීමට එකග විය.

II. නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරණ ලදි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව.**

**අ. අරමුදල් ඌණ උපයෝජනය.**

**i.රන්න මධ්‍යස්ථානය.**

රන්න ප්‍රාදේශීය මධ්‍යස්ථානයට වාර්ෂිකව වෙන්කළ රු. 100,000 න්, රු. 85,346.54 ක් පුහුණු වැඩසටහන් සඳහා වියදම් කරන ලදි. වර්ෂය අවසන් වනවිට ඉතිරි මුදල රු. 14,653.46 කි. 2018 වසර තුලදී රන්න ප්‍රාදේශීය මධ්‍යස්ථානය තුල පවත්වනු ලැබූ කෙටිකාලීන පුහුණු වැඩසටහන්වලදී හා පහත සඳහන් වැඩසටහන්වලදී ප්‍රවාහන පහසුකම හා සංග්‍රහ වියදම සඳහා අත්තිකාරම් ලබා ගැනීමට අවශ්‍ය නොවූ හෙයින් මුදල් ඉතිරි වී ඇත. එයට හේතුව වන්නේ වෙනත් වැඩසටහනවලට භාවිතා කළ ප්‍රවාහන පහසුකම් එම දිනයේදීම මේ සඳහා භාවිතා කිරීමයි.

2018. 11. 23 දින ජාතික තරුණ සේවා සභාවේ එරමිණියාය පුහුණු මධ්‍යස්ථානය තුළ පුහුණු ලාභීන් 95 දෙනෙකු සඳහා පවත්වනු ලැබූ වැඩසටහන තුල දී ප්‍රවාහන පහසුකම් ලබා ගැනීමේදී බස් රථයෙන් ගමන් කර මෙම වැඩසටහන සිදුකිරීම හා 2018. 09. 18 හා 19 යන දෙදින තුල වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරීන් 38 දෙනෙකු වෙනුවෙන් පැවති වැඩසටහන තුල දී දෙදින සංග්‍රහ වියදම් එම ලේකම් කාර්යාලය විසින් දැරීම හේතුවෙන් මේ සඳහා වෙන්කර කර තිබූ අත්තිකාරම් මුදල් වියදම් නොවී ඉතිරි වී තිබේ.

අම්පාර මධ්‍යස්ථානය.

2018 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුව අම්පාර පුහුණු මධ්‍යස්ථානය සඳහා වෙන් කර ඇති සමස්ථ මුදල රුපියල් ලක්ෂයකි. එහිදී උපදේශන ගුරුවරුන් සිවිල් ආරක්ෂක නිලධාරින් හා රාජ්‍ය නිලධාරීන් සඳහා වැඩසටහන් තුනකට රු. 24,500.00 බැගින් රු. 73,500.00 ක මුදලක් ඇස්තමේන්තු කරන ලදි. මෙම මුදල් ඇස්තමේන්තු කිරිමේදි ආයතනය මගින් ප්‍රවාහන පහසුකම් සැලසිමට අපේක්ෂා කළද ප්‍රායෝගික තත්වයක් යටතේ ඒ සඳහා පොදු ප්‍රවාහන පහසුකම් සලසා ගැනිමට මෙන්ම වෙනත් පාඨමාලා සඳහා යොදාගත් ප්‍රවාහන පහසුකම් යොදා ගැනිමට සිදුවිය. ඒ අනුව රු. 73,500.00 ක ඇස්තමේන්තු මුදලින් පාඨමාලා 3 ක් සඳහා වියදම් වූයේ රු. 47,770.00 කි. අනෙක් වැඩසටහන් අතරින් මානසික සෞඛ්‍යය දින වැඩසටහන් සඳහා රු. 13,000.00 ක මුදලක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙන් වෙන් කල අතර එම මුදල නිසි පරිදි වියදම් විය.

ක්ෂේත්‍ර අධික්ෂණ නිලධාරීන්ගේ පුහුණු වැඩසටහන සඳහා වාර්ෂික ඇස්තමේන්තුගත මුදල රු. 13,500.00 ක් වූ අතර එහිදී වියදම් වී ඇති මුදල රු. 13,101.00 කි. ඒ අනුව අම්පාර මධ්‍යස්ථානය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මගින් වෙන් කල රුපියල් ලක්ෂයක මුදලින් පිළිවෙලින්,

| දිනය. | විස්තරය. | වියදම. (රු.) |
|---|---|---|
| 2018. 03. 23, 24. | පාසැල් උපදේශන ගුරුවරුන් 40 සඳහා. | 13,049.00 |
| 2018. 07. 17, 18. | ප්‍රජා පොලිස් ඒකක නිලධාරීන් 40 සඳහා. | 16,200.00 |
| 2018. 08. 02, 03. | ප්‍රජා නායකයින් බලසතු කිරීම තුලින් අඩු වයස් විවාහකයන් අවම කිරීම. | 18,421.00 |
| 2018. 11. 16. | දමිළ මාධ්‍ය ක්ෂේත්‍රයේ උපදේශකවරුන්ගේ ධාරිතා වර්ධනය කිරීමේ එක්දින පුහුණු වැඩසටහන. | 13,101.00 |
| 2018. 10. 26. | නව යොවුන්වියේ දරුවන්ගේ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන පුහුණු කඳවුර. | 13,000.00 |

එකතුව රු. 73,771.00 ක් වියදම් වී ඇත. ඉතිරි මුදලින් දෙමළ මාධ්‍ය ක්ෂේත්‍ර අධීක්ෂන නිලධාරීන් සඳහා පුහුණු පාඨමාලාවක් පැවැත්වීමට කටයුතු කළ අතර එහිදී වියදම් වී ඇති මුදල රු. 15,215.00 කි. එබැවින් අම්පාර මධ්‍යස්ථානය සඳහා 2018 වර්ෂයේදී වෙන් කළ මුදලින් රු. 88,986.00 ක් වියදම් වී තිබේ. 2018 වර්ෂයේදී වෙන් කරන ලද සම්පූර්ණ මුදල වූ රු. 100,000.00 ක මුදලින් රු. 88,986.00 ක් වියදම් වී ඇති අතර රු. 11,014.00 ක මුදලක් වියදම් වී නොමැත. එම මුදල් වියදම් නොවූයේ ප්‍රවාහන වියදම් ඉතිරිවීම නිසාය.

තලාව මධ්‍යස්ථානය.

**2018** වර්ෂයේදී තලාව පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වූ කෙටිකාලීන පුහුණු වැඩසටහන් සඳහා රු.**100,000/-**ක මුදලක් වෙන්ව තිබූ අතර උක්ත පාඨමාලා සඳහා අප විසින් මුදල් වියදම් කරන ලද ආකාරය පහත පරිදි වේ.

| අනු අංකය. | පාඨමාලාවේ නම. | වියදම් වූ මුදල (රු.) |
|---|---|---|
| **01.** | අනුරාධපුර අධ්‍යාපන කලාපයේ පෙර පාසල් ගුරුවරුන්ගේ අධ්‍යාපන උපදේශනය පිළිබඳ ධාරිතා සංවර්ධනය | **26,475.73** |
| **02.** | විදුහල්පතිවරුන් සඳහා මූලික උපදේශන කුසලතා සංවර්ධනය | 19,438.49 |
| **03.** | මූලික උපදේශන කුසලතා සංවර්ධනය | 23,697.12 |
| **04.** | මානසික සෞඛ්‍ය දිනය තලාව මධ්‍යස්ථානයේ පැවැත්වීමට තිබුණද,අමාත්‍යාංශය මඟින් කරන ලද වැඩසටහන සඳහා යොදා ගන්නා ලදී | **13,000.00** |
| **05.** | ක්ෂේත්‍ර අධීක්ෂණ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන | **17,375.00** |

ඒ අනුව උක්ත වැඩසටහන් සඳහා සමස්ථ වියදම වශයෙන් රු. **99,986/-** ක මුදලක් වියදම් වූ අතර ඇස්තමේන්තු ගත මුදලින් ඉතිරි වූයේ රු. **13.66** ක මුදලක් පමණි.

කිළිනොච්චිය මධ්‍යස්ථානය.

| අනු අංකය | පැවැත්වූ දිනය | ඇස්තමේන්තු ගත මුදල (රු.) | වියදම් වූ මුදල (රු.) | සහභාගි වූ සම්පත්දායීන් පිළිබඳ විස්තර |
|---|---|---|---|---|
| 01. | 2018. 04. 2/3. | 24,500.00 | 13,090.00 | තුනුක්කායි ප්‍රාදේශිය කාර්යාලයේ පරිපාලන නිලධාරීන්,සමෘද්ධි සංවර්ධන නිලධාරින්,කළමනාකරණ සහකාර සහ ග්‍රාම නිලධාරින්. |
| 02. | 2018. 05. 14/15. | 24,500.00 | 13,920.00 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කිළිනොච්චි බලකා මූලස්ථානයට අනුයුක්තව පවත්වාගෙන යනු ලබන පෙර පාසල් ගුරුවරුන්. |
| 03. | 2018. 06. 7/8. | 24,250.00 | 15,325.00 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු කිළිනොච්චි බලකා මූලස්ථානයට අනුයුක්තව පවත්වාගෙන යනු ලබන පෙර පාසල් ගුරුවරුන්. |
| 04. | 2018. 08. 30. | 12,700.00 | 10,610.00 | ජ්‍යෙෂ්ඨ පුහුණු කිරීමේ නිලධාරින් සඳහා එක්දින උපදේශන පුහුණු වැඩසටහන. |
| 05. | 2018. 10. 25/26 | 13,000.00 | 8,500.00 | මානසික සෞඛ්‍ය දින වැඩ සටහන (එක් දින වැඩසටහන්). |

කිලිනොච්චි මධ්‍යස්ථානයේ 2018/04/02,2018/05/14,2018/06/07,2018/08/30 යන දිනයන්හි පැවැත්වූ වැඩසටහන් වෙනුවෙන් මුදල් ඉතිරිවීමට හේතු පහත පරිදි වේ.

01.සහභාගි වන්නන්ගේ අඩුවීම නිසා සහතික පත්‍ර හා සංග්‍රහ වෙනුවෙන් වෙන්කල මුදල් භාවිතය ප්‍රමාණවත්ව අඩුවිම.

02.වැඩසටහන් වෙනුවෙන් ප්‍රවාහනයට ඇස්තමේන්තු කල මුදල් වැය නොකිරීම.
මෙයට හේතුව වූයේ ආයතනය මඟින් කිලිනොච්චි මධ්‍යස්ථානයේ පවත්වාගෙන යනු ලබන උපදේශනය පිළිබඳසහතිකපත්‍ර හා ඩිප්ලෝමා පාඨමාලා සඳහා වෙන්වූ වාහනයම කෙටිකාලීන වැඩසටහන් වෙනුවෙන් ද යොදා ගන්නා ලදී.නමුත් මෙසේ එක්වර ගමන් කළ හැකි බව පුරෝකථනය කළ නොහැකිවීම නිසා කෙටිකාලීන වැඩසටහන් සඳහා එසේ ප්‍රවාහනය සඳහා මුදල් වෙන් කරන ලද නමුත් උක්ත පරිදි එකම වාහනය භාවිතා කරමින් වැඩසටහන් කිහිපයකට සහභාගී වීම අපහසු නොවූ බැවින් එසේ යොදා ගැනීම හේතුවෙන් මෙම මුදල් ඉතිරි වී ඇත.

ප්‍රධාන කාර්යාලය (කොළඹ).

| අනු අංකය | පැවැත් වූ දිනය | ව්‍යාපෘතියේ නම. | ඇස්තමේන්තුගත මුදල (රු.) | වියදම (රු.) |
|---|---|---|---|---|
| 01. | 2018. 10. 15 | ලෝක මානසික සෞඛ්‍ය දින වැඩසටහන - අනුරාධපුර. | 10,000.00 | 8,500.00 |
| 02. | 2018. 06. 28 | ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන. | 55,000.00 | 50,695.00 |
| 03. | 2018. 09. 31 | අතුරු ව්‍යාවස්ථාව සංස්කරණය කිරීම. | 35,000.00 | 35,000.00 |
| 04. | 2018. 11. 30 | නායකත්ව සංවර්ධනය,කෙටිකාලීන පුහුණු වැඩසටහන. (පොලිස් විශේෂ කාර්යය බලකාය-කළුතර විසින් මුදල් ලබාදී ඇත). | | - |

ප්‍රධාන කාර්යාලයේ කෙටිකාලීන පුහුණු වැඩසටහන සඳහා 2018 වර්ෂයේ රු. 100,000.00 මුදලක් වෙන් කර තිබුණි. එම මුදලින් වැඩසටහන් 03 ක් සඳහා ඉහත දැක්වෙන පරිදි රු. 94,195.00 ක් වියදම් කර තිබුණි. එම වෙන් කළ රු. 100,000.00 න් රු. 5,805.00 ක් ඉතිරි වී ඇත.

විගණන විමසුමේ සඳහන් පරිදි ප්‍රධාන කාර්යාලය (කොළඹ) හා ප්‍රාදේශිය මධ්‍යස්ථාන 04 වන රන්න,අම්පාර, කිලිනොච්චිය හා තලාව සඳහා එක මධ්‍යස්ථානයකට රු. ලක්ෂය බැගින් 2018 ක්‍රියාකාරී සැලැස්මේ රු. ලක්ෂ 05 ක මුදලක් වෙන් කර තිබුණි. විගණන විමසුමේ සඳහන් පරිදි එම මධ්‍යස්ථානවල වැඩසටහන් සඳහාරු. 393,130.00 ක් වියදම් කර රු.106,870.00 ක් ඌණ උපයෝජනය වී තිබුණි.

නමුත් සැබෑ ලෙසම එක් එක් මධ්‍යස්ථානවලට වෙන්කළ මුදල් ඉතිරි වී ඇත්තේ පහත පරිදිය.

| අනු අංකය | මධ්‍යස්ථානය | ඉතිරි වී ඇති මුදල (රු.) |
|---|---|---|
| 01. | කිලිනොච්චිය | 37,505.00 |
| 02. | ප්‍රධාන කාර්යාලය (කොළඹ) | 5,805.00 |
| 03. | තලාව | 13.66 |
| 04. | අම්පාර | 11,014.00 |
| 05. | රන්න | 14,653.46 |
| | එකතුව | **68,991.12** |

ii. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අප දැඩි උත්සාහයක් ගත්තද වැඩසටහන ක්‍රියාත්මක නොවීමට පසුගිය 2018 වසරේ සිදු වූ පරිපාලනමය වෙනස්කම් විශාල ලෙස බලපාන ලදි. කෙසේ වුවද ඉදිරියේ දී මෙවැනි කටයුතු සිදු නොවීමට වගබලා ගන්නා ලෙස අදාල අංශ ප්‍රධානීන් සියළු දෙනා වෙත උපදෙස් ලබා දී ඇත.

ආ.කොන්ත්‍රාත් පරිපාලන අඩුඅපාඩු.

ඉදිරියේ දී කෙනේත්‍රාත් සඳහා අත්තිකාරම් ලබාදීමේදී 20% උපරිම සීමාව ක්‍රියාත්මක කිරීමටත් කොන්ත්‍රාත් සඳහා ගිවිසුමක් අත්සන් කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

## 03. වෙනත් විගණන නිරීක්ෂණ.

අ. ආයතනය සඳහා 2016-2020 වසර 05 වෙනුවෙන් සංයුක්ත සැලැස්මක් සකස් කර ඇත. ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී ලබාදුන් උපදෙස් අනුව මේ වනවිට 2019-2021 වසර 03 සඳහා සංයුක්ත සැලැස්ම සකස්කර විශේෂඥ උපදෙස් සඳහා යොමු කර ඇත.

ආ. කාර්යය මණ්ඩල පරිපාලනය.

i. 2014 වසරේ පුරප්පාඩු වූ මහාචාර්ය තනතුරු සඳහා වරින්වර ඉල්ලුම්පත් කැඳවූවද සුදුසුකම්ලත් අයදුම්පත් නොලැබුණි. බඳවා ගැනීම් පටිපාටිය වෙනස් කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් වරින්වර ඉල්ලීම් කළ ද මේ සඳහා අනුමැතිය නොලැබුණි. ඉන් අනතුරුව පාලක සභාවේ තීරණය අනුව කොන්ත්‍රාත් පදනම මත මහාචාර්ය තනතුර සඳහා බඳවා ගැනීමට 2018 ජූලි මස අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදි. ඒ අනුව අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2019 පෙබරවාරි මස අනුමැතිය ලැබී ඇති අතර කොන්ත්‍රාත් පදනම මත එක් වසරකට මහාචාර්යවරයෙකු බඳවා ගැනීමට කටයුතු සිදු කෙරෙමින් පවතී.

ii. ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර 2018 ජනවාරි මස 05 දින සිට පුරප්පාඩු වූ අතර03/2018 චක්‍රලේඛයට අනුව එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල්වරයාට තවත් මාස 06 කින් සේවා කාලය දීර්ඝ කරණ ලදි. කොන්ත්‍රාත් පදනම මත සිටි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කොන්ත්‍රාත් පදනම මත සේවය කළ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කොන්ත්‍රාත් කාලය අවසන් වූ පසු 2018 ජූලි 08 දින සිට වැඩ ආවරණය සඳහා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යයන) පත් කරන ලදි. මේ වනවිට ස්ථිර අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු බඳවා ගැනීම සඳහා කටයුතු සිදු කෙරෙමින් පවතී.

iii. සුදුසුකම් ලත් අයදුම්කරුවන් ඉදිරිපත් නොවීම හේතුවෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි විය.

iv. සුදුසුකම් ලත් අයදුම්කරුවන් ඉදිරිපත් නොවීම හේතුවෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි විය.

- **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය.**

  දිගින් දිගටම අයදුම්පත් කැඳවන ලද අතර සුදුසුකම් ලත් අයදුම්කරුවන් ඉල්ලුම් නොකිරීම හේතුවෙන් තනතුරු පුරප්පාඩු පැවතිණි. 2018.04.06 දින රජයේ ගැසට් පත්‍රයේ පලකර අයදුම්පත් කැඳවා සුදුසුකම් ලැබූ අභ්‍යන්තර අයදුම්කරුවන් දෙදෙනෙක් 2018.08.01 දින සිට තනතුර සඳහා උසස්වීම් ලබාගන්නා ලදී. මේ වන විට නැවත බඳවා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී.

- **ජ්‍යෙෂ්ඨ පුහුණු නිලධාරී.**

  මෙම තනතුර සඳහාද දිගින් දිගටම අයදුම්පත් කැඳවූ අතර සුදුසුකම් ලත් ඉල්ලුම්පත් නොලැබීම හේතුවෙන් බඳවා ගැනීමට නොහැකි විය.2018.04.06 එල කරන ලද ගැසට් පත්‍රයට අනුව සුදුසුකම් ලත් එක් අභ්‍යන්තර අයදුම්කරුවෙකු පමණක් උසස්වීම් ලබාගන්නා ලදී.ආයතනයේ පාලක මණ්ඩලයේ අනුමැතිය මත තනතුරේ බඳවා ගැනීම් පරිපාටිය නැවත සංශෝධනය කරමින් පවතී. එම සංශෝධන අවසන් වූ වහාම බඳවා ගැනීම් සිදු කිරීමට නියමිතය.

- **ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී.**

  මෙම තනතුරටද වරින්වර බඳවා ගැනීම් සඳහා අයදුම්පත් කැඳවූ අතර සුදුසුකම්ලත් අයදුම්පත් නොලැබීම හේතුවෙන් බඳවා ගැනීමට නොහැකි විය. 2018.04.06 එල කරන ලද ගැසට් පත්‍රයට අනුව සුදුසුකම්ලත් එක් අභ්‍යන්තර අයදුම්කරුවෙකු හා බාහිර අයදුම්කරුවෙකු තේරිපත් විය.ආයතනයේ පාලක මණ්ඩලයේ අනුමැතිය මත තනතුරේ බඳවා ගැනීම් පටිපාටිය නැවත සංශෝධනය කරමින් පවතී.එම සංශෝධන අවසන් වූ වහාම ඉතිරි තනතුර සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට නියමිතය.

- **පුහුණුකිරීමේ නිලධාරී.**

  පුහුණු නිලධාරී තනතුරේ සිටි නිලධාරියෙකු ජ්‍යෙෂ්ඨ පුහුණු නිලධාරී තනතුරට උසස්වීම් ලැබීම හේතුවෙන් මෙම තනතුර පුරප්පාඩු වී ඇත. එය ඉදිරියේ දී ගැසට් පත්‍රයේ පල කර බඳවා ගැනීම් සිදු කිරීමට නියමිතයි.

- **පර්යේෂණ නිලධාරී.**

  පර්යේෂණ නිලධාරී තනතුරේ සිටි නිලධාරීන් 06 දෙනෙකුගෙන් 2018 වසරේදී එක් අයෙකු ජ්‍යෙෂ්ඨ පර්යෙෂණ නිලධාරී තනතුර උසස්වීම් ලැබීම හා දෙදෙනෙකු විශ්වවිද්‍යාල රැකියාවන් සඳහා සේවයෙන් ඉල්ලා අස්වීවීම හේතුවෙන් තනතුරු පුරප්පාඩු වී ඇත.මෙම බඳවා ගැනීම් පරිපාටියේද පාලක සභා අනුමැතිය මත සංශෝධන සිදුවෙමින් පවතින අතර එය අවසන් වූ වහාම ඉතිරි බඳවා ගැනීම් සිදු කිරීමට නියමිතය.

- **කථිකාචාර්ය-I.**

  කථිකාචාර්ය-II ශ්‍රේණියට පමණක් බඳවා ගැනීම් සිදු කරනු ලබන අතර II ශ්‍රේණියේ වසර 10 ක සේවා කාලයෙන් පසු අදාල කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම සලකා බලා I ශ්‍රේණියට උසස්වීම් සිදු කරයි.

- **කථිකාචාර්ය-II.**

  කථිකාචාර්ය-II තනතුරේ පවතින පුරප්පාඩු සඳහා ඉදිරියේදී බඳවා ගැනීම් සිදු කිරීමට නියමිතව ඇත. මෙම තනතුරේද බඳවා ගැනීම් පරිපාටි සංශෝධනය වෙමින් පවතී.

- **ඉංග්‍රීසි උපදේශක-III.**

  මේ සඳහාද දිගින් දිගටම අයදුම්පත් කැඳවුවද සුදුසුකම්ලත් අයදුම්පත්නොලැබුණි. 2018.04.06 දින ගැසට් පත්‍රයේ පුරප්පාඩු පලකර බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණ පැවැත්වුවද තේරිපත් වූ සුදුසුකම් සහිත එකම නිලධාරිනිය පත්වීම් බාර නොගන්නා ලදී. මෙම බඳවා ගැනීම් පරිපාටියද පාලක සභා අනුමැතිය මත සංශෝධනය සිදුකරමින් පවතී. එය අවසන් වූ වහාම බඳවා ගැනීමට නියමිතයි.

ඇ. ලැබිය යුතු මුදල්.

I. සිසුන්ගෙන් අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන අතර එම ක්‍රියාවලිය කාර්යක්ෂමව කිරීමට මූල්‍ය අංශය හා අධ්‍යයන අංශ ප්‍රධාන නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇත.

ii. මෙම මුදල යුනිසෙෆ් ආයතනය විසින් ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශ ගිණුම වෙත බැර කර ඇති බව අනාවරණය කරගන්නා ලදි. මෙම මුදල් ජාතික සමාජ සංවර්ධන ආයතනය වෙත මාරු කිරීමට කටයුතු කරමින් පවතී.
ඇ. මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු කර නිසි පාලනයක් සහිතව අයවැය ගත වියදම් සිදුකිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදි.

එම්. ටී. ආර්. ෂාමිණී අත්තනායක,
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.),
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යයන),
ජාතික සමාජ සංවර්ධන ආයතනය.